**2020 දෙසැම්බර් මස 10 වන දින පෙරවරු 9.30 ට මොරටුව මහා නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද මොරටුව මහා නගර සභාවේ 2020 දෙසැම්බර් මස මාසික සභා රැස්වීමේ වාර්තාව**

**සහභාගීත්වය:-**

| | | | |
|---|---|---|---|
| 01. | නගරාධිපති | - | ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා |
| 02. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩී. සමන්ත සිල්වා මහතා |
| 03. | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්. සුරංග නිශාන්ත අපෝන්සු මහතා |
| 04. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා |
| 05. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 06. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්. ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා |
| 07. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්. ඔසඳ හර්ෂන අබේකෝන් මහතා |
| 08. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා |
| 09. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.ඩබ්ලිව්. රන්දු නිරෝෂන මහතා |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. නාලනී ප්‍රේමවතී ප්‍රනාන්දු මහත්මිය |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | පී. අශෝක ඉන්ද්‍රතිලක ප්‍රනාන්දු මහතා |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.එම්. මහේෂ් රුක්මාල් ඩයස් මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | පී. යසන්ත රන්සිරි ප්‍රනාන්දු මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.ඩබ්ලිව්.එම්. නිෂා ඉරානි විජේවික්‍රම මහත්මිය |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩී. අනුර ප්‍රනාන්දු මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. ලලිත් ප්‍රනාන්දු මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්. බේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | එෆ්.බී. නිලංක සිල්වා මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.කේ.පී. සුසන්ත පෙරේරා මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්ලිව්. ප්‍රිනිත් ක්‍රිෂාන්ත විජේරත්න මහතා |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. කුමාර රාජරත්න මහතා |
| 23. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. පිලිප් ෆැන්සිස් ප්‍රනාන්දු මහතා |
| 24. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. ජයමාල් ශ්‍රියාරත්න මහතා |
| 25. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී. මල්ලිකා ජයවතී ප්‍රනාන්දු මහත්මිය |
| 26. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්. උජිත් ක්‍රිෂාන්ත කල්දේරා මහතා |
| 27. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ. දීපා චාන්දනී ආරියවංශ මහත්මිය |
| 28. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා |
| 29. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්ලිව්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා |
| 30. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. සුනිල් නන්දසිරි මහතා |
| 31. | මහා නගර සභා මන්ත්‍රී | - | රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා |
| 32. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. සජිත් දුමින්ද පීරිස් මහතා |
| 33. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. තිසර රසාංජන මැන්දිස් මහතා |
| 34. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා |
| 35. | මහා නගර සභා මන්ත්‍රී | - | ආර්.එම්.ඒ. දෝන දිලාශිනී මහත්මිය |

| | | | |
|---|---|---|---|
| 36. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 37. | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්. නිරෝෂන් රුවමාල් අපෝන්සු මහතා |
| 38. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. සුදර්ශනි ප්‍රියන්තිකා කුරේ මහත්මිය |
| 39. | මහා නගර සභා මන්ත්‍රී | - | මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය |
| 40. | මහා නගර සභා මන්ත්‍රී | - | සිත්ති මසීනා බක්කර් මහත්මිය |
| 41. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය |
| 42. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්ලිව්. ශ්‍රියානි හේමලතා ප්‍රනාන්දු මහත්මිය |
| 43. | මහා නගර සභා මන්ත්‍රී | - | ආර්. ක්‍රිෂනි ප්‍රනාන්දු මහත්මිය |
| 44. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා |
| 45. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්ලිව්.පී. ප්‍රභාෂනි වික්‍රමසිංහ මහත්මිය |
| 46. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්. සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 47. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්ලිව්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |

සහ

නාගරික ලේකම් (වැ.බ.) - එම්.කේ.ඩී. තාරක මුණසිංහ මහතා

ගරු නගරාධිපතිතුමාගේ ආරාධනය මත වැඩ බලන නාගරික ලේකම් එම්.කේ.ඩී. තාරක මුණසිංහ මහතා විසින් 2020.12.10 වන දින මාසික සභා රැස්වීමේ කැඳවීමේ නිවේදනය සභාවට ඉදිරිපත් කරන ලදි.

## 01. වාර්තාව පිළිගැනීම හා සලකා බැලීම.

2020.11.05 දින පැවැති මාසික සභා රැස්වීම් වාර්තාව.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 2020.11.05 දිනැති රැස්වීම් වාර්තාව සභා වාර්තාව පිළිගත යුතු යැයි මා සභාවට යෝජනා කර සිටිනවා.

මහා නගර සභා මන්ත්‍රී, එච්. ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව 2020.11.05 දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

## 02. ගරු නගරාධිපතිතුමාගේ නිවේදන -

### 02(01) නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා

නිවේදන යටතේ විශේෂයෙන්ම අද දින අසනීප තත්ත්වය නිසා සභාවට සහභාගීවීමට නොහැකි බව පිලිප් ගාවින් මත්තෙස් ගරු මන්ත්‍රීතුමා විසින් දන්වා එවා තිබෙනවා.

## 03. <u>සභාව අමතා එවන ලද ආයාචනා, පෙත්සම්, පැමිණිලි හා සංදේශ සභාව හමුවේ තැබීම.</u>

**03(01)** <u>මහා නගර සභා මන්ත්‍රී - මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මම සභාගත කරනවා නගර සභාවට අයත්ව තිබූ පීරිස් මාවත කෙළවරේ තිබෙන ඉඩම නගර සභාව බෙදා වෙන් කරලා දුන්නා ඔබතුමා බිම් සවිය යටතේ. එහි නුග ගහක් තිබෙනවා. එම නුග ගහ යාබද පුද්ගලයින් විසින් වට කරගෙන කම්බි වැටක් ගැසීමේ උත්සහයක නියැලෙනවා. ඒ නිසා එය පොදු දෙයක් හැටියට භාවිතා කරන්න අවශ්‍ය කටයුතු සලසා දෙන්න කියලා ඉල්ලා සිටිනවා. ඔබතුමා ගිය සති දෙක පුරාවටම විශාල පරිශ්‍රමයක් දැරුවා ඒ සම්බන්ධයෙන්. ඒ ගැන බෙහෙවින් මම ස්තූතිවන්ත වෙනවා. ප්‍රදේශවාසීන්ගේ ලිපිය මම සභාගත කරනවා .

**03(02)** <u>මහා නගර සභා මන්ත්‍රී - මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා</u>

ඒ වගේම ගරු නගාධිපතිතුමනි, ඉදිරියේ පැවැත්වෙන නත්තල් උත්සවය නිමිතිකොටගෙන නගර සභාවේ සේවකයින්ට උත්සව අත්තිකාරම් ලබා නොදීමට තීරණයක් ගෙන තිබෙන බව අපට දැන ගන්න ලැබෙනවා. මේ පිළිබඳවත් ඔබතුමාගේ අවධානය යොමු කරලා ඒ සේවකයින්හට ඔවුන්ගේ වරප්‍රසාද යටතේ අපි කථා කරලා බැලුවම අනෙක් පළාත් පාලන ආයතනයන්හි සේවකයින්ට එම උත්සව දීමනාව ලබා දී තිබෙනවා. ඒ නිසා මේ ගැන ඔබතුමාගේ අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**03(03)** <u>මහා නගර සභා මන්ත්‍රී - එල්. සේනක දමයන්ත සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, විශේෂයෙන්ම ප්‍රථමයෙන් ඉල්ලීමක් කරනවා ඔබතුමාගෙන් පසුගිය දවසක, ගිය සතියේ දවසක ලොකු ඛේදවාචකයක් මොරටුවේ ඇති වුණා. එකම පවුලේ කුඩා දරුවන් තිදෙනෙක් කහ ඉරේ රිය අනතුරකට භාජනය වුණා. ඒ අම්මා අද වෙනකොට ජීවිතයත් මරණයත් අතර රෝහල් ගත වෙලා ඒ තත්ත්වයෙන් ඉන්නවා. අපි සභාවක් විදිහට මේ දරුවන් තුන්දෙනා වෙනුවෙන් අපි විනාඩියක නිශ්ශබ්දතාවයක් පළ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

<u>නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීතුමනි, සභාවේ එවැනි කටයුත්තක් කරන්න ඕනෑද කියලා මම නම් දන්නේ නෑ. අපි කළයුතු දේවල් ගොඩක් තියෙනවා ඒ වෙනුවෙන් කරන්න. මොකද මේ ගෞරවනීය සභාවේ අපි එහෙම ගෞරව කරන්න ඕන ඒ සම්බන්ධයෙන් මේ වේලාවක් ආරක්ෂා කරන්න ගියොත් මින් ඉදිරියේදී මේ වගේම තැන් ඕන තරම් නිර්මාණය වෙන්න පුළුවන්. ඔබතුමා හිටපු නැති කාලෙක වෙන්නැති සමහරවිට එකම බස් රථයකට 16 දෙනෙක් මිය ගියා. එතකොටත් එහෙම අවස්ථාවක් වුණේ නෑ. මේකට අපේ අකමැත්තක් නෙමේ තියෙන්නේ. නමුත්, මේක සුදුසු ද සභාවේ කියන ප්‍රශ්නේ විතරයි මම නගරාධිපතිවරයා විදියට දකින්නේ.

**03(04)** <u>මහා නගර සභා මන්ත්‍රී - එල්. සේනක දමයන්ත සිල්වා මහතා</u>

ඊට අමතරව නගරාධිපතිතුමනි, පෙත්සම් හා පැමිණිලි යටතේ කෝවිල පාර රනිල් කුරේ මහත්මා ප්‍රමුඛ පිරිසක් විසින් ඉදිරිපත් කරන ලද පෙත්සමක් ඉදිරිපත් කරනවා. ඉල්ලීමක්. මේ පාර

කෙළවරේ එක් පුද්ගලයෙක් විසින් කොටසක් අල්ලා ගෙන සිටීම නිසාවෙන් මේක ලොකු අවහිරතාවයක් පවුල් ගණනාවකට පැන නැගිලා තියෙනවා. මේක ඉතාම වැදගත් අවශ්‍යතාවයක් ලෙස සලකලා කඩිනමින් මේක ලබාදීමට කටයුතු කරන්න කියලා ඉල්ලීම් කරනවා. ඒ එක්කම පීරිස් මාවතේ ජනතාව ඉල්ලීමක් කළා. පීරිස් මාවත කෙළවරේ දැනට මේ වෙනකොට කාපට් දාගෙන ඒ වැඩ ටික ක්‍රියාත්මකවීගෙන යනවා. ඒ එක්කම කාණු කඩලා ඉවර වෙලා. අවහිරතාවයක් තියෙද්දි, ඊයේ හවස ගිහිල්ලා කොටසක් ඇදලා තිබ්බා. කොන්ත්‍රාත්කරු දවස් ගාණක් ඇවිල්ලා නැතුව ඉඳලා, ඊට පස්සේ ඉතුරු එක අද කරනවා කියලා තියෙනවා. ඒ අය ඉල්ලා සිටිනවා විශේෂයෙන්ම ගොඩක් අය ඉන්නේ ආගමේ අය. නත්තල් උත්සව සමරන්න බලාපොරොත්තුවෙන් ඉන්න අය. ඒ නිසා ඉක්මනින් කඩිනමින් කරන්න කියලා කියනවා. ඒ වගේම නගර සභා සේවකයින්ට මැක්සි මන්ත්‍රීතුමා මතක් කළා වගේ උත්සව අත්තිකාරම් ලබා දීමට කඩිනමින් කටයුතු කරන්න කියලා ඉල්ලීමක් කරනවා.

**03(05)** <u>මහා නගර සභා මන්ත්‍රී - එල්. සේනක දමයන්ත සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, පසුගිය දවසක මම ඔබතුමාටත් කථා කළා. කටුබැද්ද සොයිසා ක්‍රීඩාංගනයේ ඇවිදින පුද්ගලයින් සම්බන්ධව විටින් විට ඒ අයට තමුන්නාන්සේගේ නියෝග අනුව, විටින් විට ඇවිදින්න අවස්ථාව ලබා දෙන්නේ නෑ. ඊයේ පෙරේදා වනවිට ඒ අවස්ථාව නැවත ලබාදීලා තියෙනවා. කලිනුත් ඔය වගේ තත්ත්වයක් වෙලා මමත් කථා කළා, තමුන්නාන්සේ ලබා දුන්නා. ඒත් තමුන්නාන්සේ හේතු විදිහට දක්වන්නේ මෙහි යම් සෙනගක් රැස් වෙනවා. ව්‍යායාම කෙරෙද්දි මීට වඩා අපේ ගේ ළඟ තිබෙන ඇවිදින මං තීරුව වෙන්න පුළුවන්. ලුනාවේ මං තීරුව වෙන්න පුළුවන්. විශාල සෙනගක් පරිහරණය කරනවා. ඒ අවස්ථාව ලබා දෙන්න. මේක ජාත්‍යන්තර ක්‍රීඩාපිටියක් බවට පරිවර්තනය කරන්න ක්‍රිකට් ආයතනය සමග සම්බන්ධවෙලා කටයුතු කරනවා කියලා. හැබැයි නගරාධිපතිතුමනි, ටිකක් සැලකිලිමත් වෙන්න. අපි 1980 ගණන් වලින් පසුව මට මතක විදියට අපට මෙහි ජාත්‍යන්තර ක්‍රිකට් තරඟයක් පවත්වන්න බැරි වෙලා තියෙනවා. ඊට පස්සේ එකක් එනවා 19 න් පහළ වර්ල්ඩ් කප් එක විතරක් ජාත්‍යන්තර තරඟයක් විදියට අපිට ලැබෙන්නේ. අවුරුදු 20 කින් 25 කින් ක්‍රීඩාංගනය ප්‍රයෝජනයට ගන්නට අපිට හැකියාවක් ලැබෙන්නේ නෑ මොරටුවේ පුද්ගලයින් විදිහට. ජාත්‍යන්තර ක්‍රීඩාංගනයක් බිහි වෙන කොට අපි සංතෝෂ වෙන්න ඕනෑ. හැබැයි මේකේ මූලික අවශ්‍යතාවයන් සපුරා ගන්නට අද අපිට පුළුවන් කමක් තියෙනවද කියලා ප්‍රශ්නයක් පැන නැගිලා තියෙනවා. මේක අපිම මේ නගර සභාව විසින්ම මන්ත්‍රීවරු අත් උස්සලා මේක යම්කිසි විදිහකට කප්පාදු කරලා තියෙනවා. මොකද මේකේ කේසෝන් එක තියෙන ඉඩම අපි මේක බිම් කට්ටි කඩලා මේ නගර සභාවේ අනුමැතිය ලබලා දුන්නා. ඒ ඉඩම තිබුණා නම් අපට කාර් පාර්ක් එකකට, අනෙකුත් අඩුපාඩු වලට බෙත්තාරාම වගේ තැනක ලොකු ක්‍රීඩාංගනයක් ඉදි කරන කොට විශාල වශයෙන් රථ ගාල් කරන්න ඕනෑ. ඒ එක්කම බවුන්ඩ්‍රි ලයින් එකේ ඉඳලා ආරක්ෂිතව ICC ක්‍රිකට් ක්‍රියාදාමයන් තුළ බවුන්ඩ්‍රි ලයින් ඉඳලා ආරක්ෂිත මට්ටම මීටර් 30 ක සීමාවක් තියෙන්න ඕනෑ. එතන ඉඳලා තමයි ප්‍රේක්ෂකාගාරයට යන්න පුළුවන් වෙන්නේ. අපිට මේ ක්‍රීඩාංගනය එතනට ගේන්න පුළුවන් ද කියලා හිතෙනවා. මම ජාත්‍යන්තර ක්‍රීඩාංගනයකට නැවතත් කියනවා විරුද්ධත්වයක් නෑ. හැබැයි අපෙන් වෙන්න ඕනෑ යුතුකම වගකීම වෙන්න ඕනෑ ජාත්‍යන්තර ක්‍රීඩා තරඟයක් අවුරුදු ගානකට පස්සේ නරඹනවාට වඩා ඒ ක්‍රීඩාංගනය ප්‍රයෝජනයට අරගෙන අපේ ජනතාව මොරටුවේ වෙන්න පුළුවන් ලංකාවේ වෙන්න පුළුවන් අපිට ජාත්‍යන්තරයට යොමු කරන්න පුළුවන් ක්‍රීඩකයෝ රැසක් බිහි කරන්න පුළුවන්කම තියෙනවානම් එතනයි අපේ ජයග්‍රහනය තියෙන්නේ. ඇවිදින මං තීරුවට ඒ අයට අවස්ථාවක් ලබා දෙන්න. ඒ

එක්කම මළල ක්‍රීඩා කරන අය ඉන්නවා ඒ අයටත් අවස්ථාවක් ලබා දෙන්න. ඒ වාගේම සාමාන්‍ය පුද්ගලයෝ ඉන්නවා මොරටුව ප්‍රදේශයේ පුද්ගලයින් ඉන්නවා අනෙකුත් ප්‍රදේශවල පුද්ගලයින් ඉන්නවා. මේ අයට ඒ අයගේ සහජ හැකියාවන් ඉදිරිපත් කරන්නට, ශක්තිමත් වෙන්නට ජාතික තළයට ජාත්‍යන්තර තළයට යන්න පුළුවන් තත්ත්වයක් නිර්මාණය කරන්න කියලා ඒ ඉල්ලීම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**<u>නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මහා නගර සභා මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරපු යම් කරුණු පිළිබඳව මේ වේලාවේ මං කථා නොකොළොත් ලොකු වැරදීමක් නිවැරදි කිරීමක් වෙන්නේ නැති වෙනවා. ඒක සභාගතවීමක් වෙන්නත් පුළුවන්. විශේෂයෙන්ම මේ තත්ත්වය ඇති කළේ ලෝකයේ 67 වන ක්‍රීඩාංගනය බවට පත් කළේ ඔබේ නායකයා. දිවංගත ගරු අමාත්‍ය ටිරෝන් ප්‍රනාන්දු මැතිතුමා. එතකොට ඒ කාලයේ මාරියන් කුරේ මැතිතුමා එයත් දිවංගත වුණා. එතුමා නගර සභාවේ කටයුතු කරන කාලේදී ඇවිදිනවා කියලා ග්‍රවුන්ඩ් එකට ඇතුල් වෙන්නවත් දුන්නේ නෑ. ගේට්ටු වහලා තිබුණේ අපි මේ වෙනකොට යම් යම් හේතු නිසා නැවැත්තුවා ඇරෙන්නට ඔබතුමා නොදන්නවා ඇති මොරටුව මහා නගර සභාවේ පමණක් ලංකාවේ ජාත්‍යන්තර ක්‍රීඩාංගන පවතින තැන්වල අපම පමණයි ස්පෝර්ට් මීට් වලට නොමිලේ දෙන්නේ. ඒ විතරක් නෙමේ තරඟ පවත්වන ක්‍රීඩාංගනවල පාසල් අතර පවත්වද්දී ක්‍රීඩාංගනයක් වෙන් කර ගන්න බැරි ඉතාමත්ම අඩු මුදලට ඔවුන්ට දෙනවා. ඒ තත්ත්වය මොන විදිහකටවත් වෙනස් කළේ නෑ. වෙනස් කරන්න අපි ගිවිසුම් ගත කාලසීමේදීවත් වෙනස් කළේ නෑ. අපි ඒ ඔක්කෝටම ඉඩදීලා තමයි ඒ කටයුත්ත කළේ. ඔබතුමා 19 පහළ ගැන පමණක් කථා කළේ දකුණු අප්‍රිකාව, ඕස්ට්‍රේලියාව, පකිස්ථානය පුහුණු තරග 03 ක් තිබුණා. අපි ඔය ග්‍රවුන්ඩ් එක හැදුවට පස්සේ අපි ස්කෝ බෝඩ් එක හැදුවට පස්සේ පුහුණු තරඟ 03 ක් තිබුණා. පකිස්ථානය, දකුණු අප්‍රිකාව සහ ඕස්ට්‍රේලියාව වැනි මේ වගේ පැමිණි හෙට අනිද්දා අපි බලාපොරොත්තු වෙන්නේ මොරටුවේ මිනිස්සු නිර්මාණය කරපු මහත් වූ ක්‍රීඩකයන්, ඩී.එස්. ද සිල්වාගේ ඉඳලා දුලිප් මෙන්ඩිස්, රොමේෂ් කළුවිතාරණලා කුසල් මෙන්ඩිස්ලා, තිරිමාන්නලා අවිශ්කළා මේ වගේ 50 කට වැඩි සංඛ්‍යාවක් අද ශ්‍රී ලංකා කණ්ඩායමෙන් හරියටම භාගයක් වේල්ස් කුමාර, ශාන්ත සෙබස්තියන් විද්‍යාල වලින් බිහිවෙලා තියෙන්නේ. ඒ විතරක් නොවේ මොරටු මහා විද්‍යාලයෙන් අජන්ත මෙන්ඩිස්ලා මේ වගේ අය නිර්මාණය වුණා. නිර්මාණය වෙනකොට ඔවුනගේ ලොකුම ස්ථානය බවට පත් වෙලා තිබුණේ මේ ක්‍රීඩාංගනය. මේ ක්‍රීඩාංගනයට රිචි රිචර්ඩ්සන් ඇවිල්ලා එදා 1990 ගණන්වල ඇවිල්ලා කුඩයකින් ඇනලා කිව්වා ලෝකේ තියෙන නරකම ක්‍රීඩාංගනය මේක තමයි කියලා. නරකම ක්‍රීඩාංගනය තමයි අපි ක්‍රමක් ක්‍රමයෙන් ගෙනල්ලා පුහුණු තරග 03 ක් පවත්තලා ලෝක කුසලානයක් පවත්වන්න පුළුවන් තරමට ක්‍රීඩාංගනය යථා තත්ත්වයට ගෙනාවේ. ඉදිරියේදී අපේ බලාපොරොත්තුව පහසුකම් සපයා ගෙන අපේ පාසල් වලට ඒ පහසුකම් ලබා දෙනවා වගේම. ඉදිරියේදී ඒ කටයුත්ත කරන්න අපි බලාපොරොත්තුවෙන් ඉන්නවා. ඒ ඇරෙන්නට මං හිතනවා ඇවිදින අයට අපි ඇවිදින්න එපා කියලා නෑ. ඔබතුමා දන්නේ නෑ ඇවිදින තරම කොච්චරද කියනවා නම්, අපි තණ පිඩලි 110,000 ක් හිටෙව්වා. 110,000 ක් හිටෝලා තමයි ඔය තත්ත්වයට පත් කර ගත්තේ. ඒක නිසා මං හිතන්නේ දිගින් දිගටම ක්‍රීඩාංගනය අපි නොබෝ දිනයකින්ම ගරු ක්‍රීඩා අමාත්‍ය නාමල් රාජපක්ෂ මැතිතුමා සමඟ සාකච්ඡා කරලා තියෙනවා. මේ ක්‍රිකට් තරඟ ටික ඉවර වුණාම 20 යි 20 ක්‍රිකට් තරඟ ටික ඉවර වුණාම අපි මේක යථා තත්ත්වයට පත් කරලා, නැවත ජාත්‍යන්තර තරඟ මෙතනට ගේනවා. මොකද ඒක අපිට ඔය විදියට තරග කිරීම සඳහා ඔය වගේ ජාත්‍යන්තර ක්‍රීඩාංගනයක මං හිතන්නේ ඇවිදීම අපි නතර කරලා නෑ. ඔවුන්ට ඇවිදීමට

දැනටමත් දීලා තියෙනවා. ඔවුන් ඇවිදින්න හදන්නේ ව්‍යායාම කරන්න හදන්නේ මං හිතන්නේ ඇවිදින මංතීරු ඔක්කොමවල ඔබතුමාත් දන්නවා ඇති මංතීරු තියෙනවා. මංතිරුවල ගල් තියෙනවා. අපේ දැන් මෙතන ගල් නෑ. ඔබතුමාගේ නිවස අසලම තියෙනවා තැනක්. ස්ථාන දෙකක් තියෙද්දි ඔවුන්ට කියන්නේ මේක නැත්නම් ඔවුන්ගේ ඇවිදීම නතර කරනවා කියලා. මං දන්නෑ මොන හේතුවක්ද කියලා. කොහොම වුණත් කමක් නෑ. ඔබතුමාගේ ඉල්ලීමට මම ඇහුම්කන් දෙන්නම්. අනිත් එක තමයි. කට්ට් කරලා විකිණීම මම ඔබතුමාට කියන්නම්. 2011 යම් කණ්ඩායමත් විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂ කණ්ඩායමෙන් තිබුණු ලොකුම චෝදනාව තමයි ඉඩමේ 10% සමන්ලාල් අරන්. අපේ මන්ත්‍රීවරයෙකුත් අභියෝග කළා එහෙම අරන් තියෙනවානම් ඒක පර්චස් 12 ක් තියෙනවා. දැනට ඔය තියෙන දම්රෝ එකට පිටිපස්සේ ඒක නගර සභාවට තියෙන්නේ. ඒක ගන්න ඕන කමක් තිබුණේ නෑ. මට ලක්ෂ අඩුම තරමේ 190 ක් පමණ සාක්කුවේ දා ගන්න තිබුණා. අක්කර 2.5 වැඩි නම් විතරයි 10% ගන්න ඕනෑ. හැබැයි මං කොන්දේසියක් දැම්මා. මුළු ඉඩම අක්කර 9.5 යක් තියෙන නිසා ඒකෙන් කුමන කෑල්ලක් කැඩුවත් ඒකෙන් 10% ක් සභාවට ඕනෑ කියලා කොන්දේසියක් දාලා තමයි මම වෙලෝනා එකේ මුල් ඉඩම අනුමත කළේ. ඒ අනුමතවීම නිසාම තමයි පර්චස් 12 ක් අපිට ලැබුණේ. එච්චර සත්භාවයෙන් ඒ කටයුත්ත කළේ. නමුත්, ඒත් 2011 මැතිවරණයේදී කොන්දේසියක් වුණා අපේ සුසාන් මන්ත්‍රීතුමා ඇතුළත්ව එක ස්වාධීන කණ්ඩායමත්, එක්සත් ජාතික පක්ෂයත් දිගින් දිගටම සාප්පු ලයින් එකේ කිය කියා බෙදුවා හොර ලීප්ලට් හැබැයි මම සැලුණේ නෑ. මම දන්නවා ඒ ඔප්පුවත් එක්කම නාගරික කොමසාරිස්ගේ නමින් ලියපු ඔප්පුවක් තිබුණා කියලා. අපේ ගරු මන්ත්‍රීවරයෙක් දිවංගත මන්ත්‍රීවරයෙක් ඕක කිව්වම මම කිව්වා මට ඔප්පුවක් තිබුණා නම් මගේ ඔප්පුව ලියලා දෙනවා කියලා. මම ඒක සත්භාවයෙන් ඒක කළේ. මට තිබුණා ඒ වෙලාවේ ඒක කරන්න. නමුත්, මම ඒක කළේ නෑ. මම නෙමේ ඒ දේ කළේ. මම එදා කිව්වා ඔය ඉඩම රජයේ ඉඩමක් නම් රස්කින් ප්‍රනාන්දු මහතා පාර්ලිමේන්තු මන්ත්‍රීමයි වරද කරලා තියෙන්නේ, සමන්ලාල් නෙමේ කියලා. මම වේදිකාවලත් ඒක කිව්වා. ඒහෙනම් ඒ වරද කරන්න ඕනෑ පාර්ලිමේන්තු මන්ත්‍රී, වෙලෝනා සමූහ ව්‍යාපාරය අධිපති රස්කින් ප්‍රනාන්දු මහතා හොර කමක් කරලා තියෙන්න ඕනෑ. සමන්ලාල් හොරකමක් කරන්න රජයේ ඉඩමක් මගේ නෙමේනේ. රස්කින් ප්‍රනාන්දු මහත්තයා වෙලෝනා එකට අයිති වෙච්ච ඉඩම දිගින් දිගටම ගිහිල්ලා ඔවුන්ගේ දරුවෝ විකුණලා තියෙනවා. අද ඩෙල්මේජ් ආයතනයට. ඩෙල්මේජ් ආයතනයෙන් පර්චස් 160 ක් නැත්නම් 170 ක් විකුණුවා ෆයිම් ලැන්ඩ්ලාට. ඒගොල්ලන්ගෙන් 10% ගත්තා. අන්න ඒ 10% පර්චස් 12 ක් තියෙනවා. මොරටුව මහා නගර සභාව නමින්. මෙච්චර දුර ගෙනාවා මේ තත්ත්වය. හැබැයි ඉතින් අපිට කරන්නට පුළුවන් ඩෙල්මේට් ආයතනයක් එක්ක. ගරු විපක්ෂ නායකතුමනි, අපි කථා කරලා කිව්වා ඕගොල්ලෝ මේන්ටේන් භාර අරගෙන ඔය වියදම් කරන මුදලින් මේන්ටේන් භාර අරගෙන ඕගොල්ලෝ පාලමකුත් දාගෙන මේක කරන්න කියලා. අපි ඔවුන් එක්ක සාකච්ඡා කළා. ඒක හරි ගියෙත් නෑ. අපි ලොකු උත්සහයක් අරගමු.

**03(06)** **<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ගලි රථ සේවය ලබා ගැනීම සඳහා මෙම ස්ථානයට පැමිණෙන අයට පොඩි අසාධාරණ තත්ත්වයක් සිදුවෙනවා ගරු නගරාධිපතිතුමනි, මේ වෙකොට මුදල් ලබා ගැනීමට නොහැකි තත්ත්වයක් ඒ ස්ථානයෙන් පවසනවා. වැඩ වැඩි කියලා. දැන් මේ වෙනකොට මට දුරකථන ඇමතුම් 02 ක් ආවා. ඒ ගොල්ලන්ගේ මුදල් භාර අරගෙන නෑ. ඒක නිසා ගරු නගරාධිපතිතුමනි, මේ වෙනකොට උත්සව සමයක් එන්නේ ඒ වගේම තමයි කලින් දන්නේ නෑ. මොන මොහොතේ මේක උතුරලා යනවද කියලා, පිටාර ගලනවාද කියලා. ඒක නිසා මොකක්

හරි වැඩ පිළිවෙලක් යොදලා. මම හිතන්නේ දවසකට අදින ලෝඩ් ගාන වැඩි කරලා හරි වාර ගණන වැඩි කරලා හරි මේ අයට මේ පහසුකම සපයන්න කටයුතු කරන්න කියලා ඉල්ලීම කරනවා. නගරාධිපතිතුමනි. මොකද ඉදිබැද්ද ප්‍රදේශය වැනි තැන් වල ඔබතුමා දන්නවා. අඩියක් දෙකක් හැරුව ගමන් වතුර එනවා. මේ මිනිස්සුන්ට නිතරම මාස 03 ක 04 කට සැරයක් මේක ශුද්ධ පවිත්‍ර කරන්න වෙනවා. බොහොම අඩු ඉඩම් ප්‍රමාණවල තමයි ඉන්නේ. දැනුත් දෙන්නෙක් ඉස්සරහට වෙලා ඉන්නවා. මේක ඉක්මනට කරලා දෙන්න කියලා. මම කිව්වා දැන් මේ මොහොතේ මම ගරු නගරාධිපතිතුමාව දැනුවත් කරන්නම් කියලා

**03(07)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, පෙත්සම් අයිතමය යටතේ කරුණු කිහිපයක් මතු කර ගන්න අවශ්‍යයි. විශේෂයෙන් මම මේ කරුණ මතු කර ගන්න හිටියේ, සෞඛ්‍ය කමිටුව අවස්ථාවේදී. නමුත්, කමිටු අවස්ථා කැඳවෙන්නේ නැති නිසා මේක අවස්ථාවක් කර ගන්නවා. මේක ඇත්තටම ඉල්ලීමක්. විශේෂයෙන් ඔබ කළින් සඳහන් කළ පරිදි කසළ කළමනාකරණය පිළිබඳ යම් ක්‍රියාවලියක් සභාව විදිහට ආරම්භ කරලා තියෙනවා. විශේෂයෙන් නොදිරන කසළ බෙල් කිරීමේ ක්‍රමවේදයක්. අපි දැක්කා මැෂින් 03 ක් ගෙනල්ලා තියනවා. ගරු නගරාධිපතිතුමනි, මේ කටයුත්ත සිදු කිරීමේදී මොරටුව ජනතාව ලෙස මුහුණ දෙන ප්‍රායෝගික ගැටළු කිහිපයක් තියෙනවා. විශේෂයෙන් මහල් නිවාසවල ජීවත්වන ජනතාව දැන් ගරු නගරාධිපතිතුමනි, මීට සතියකට හෝ දෙකකට පෙර සභාව මගින් ඒ ජනතාවට දැනුම්දීමක් කළා. විශේෂයෙන් මහල් නිවාසවල ජනතාව වෙනුවෙන් මම මේ කථා කරන්නේ. නොදිරන කසළ, ප්ලාස්ටික්, ඉටි කොළ, ෂොපින් බෑග් ආදි ද්‍රව්‍ය සෝදා වේලා, විටක සබනුත් යොදා සෝදන්න කියලා දැනුම්දීමක් කරලා තියෙනවා. එතකොට අපට ගැටළුවක් මතු වෙනවා ගරු නගරාධිපතිතුමනි, මහල් නිවාසයක් කියලා කියන්නේ අපි මේ ප්‍රශ්නය දිගින් දිගටම කථා කියලා තියෙනවා ඔබතුමත් මැදිහත්වෙලා තියෙනවා. ඒක ඒ තරම් පහසු කාර්යයක් නෙමේ. ඒ ජනතාව දැනුත් ඒ අදාළ ඉටිකොළ, ප්ලාස්ටික් වර්ග හෝදලා තමයි ලබා දෙන්නේ. මොකද ඒ ගෙදර තියන් ඉන්න බෑ ඒ දේවල්. හැබැයි ඒක වේලීමට ලක් කිරීම කියන එක ඒ තරම් පහසු කාර්යයක් නෙමේ. මම ඊට පස්සේ CPHI මහත්තයා එක්කත් ඒ කාරණය කථා කළා. එතුමා යම් පැහැදිලි කිරීමක් මට කළා. ඒක එතුමා කිව්වේ වේලනවා කියන්නේ අව්වේ දාලා වේලන එක නෙමේ කියලා. ඊට පස්සේ ඒක මම ඒ ජනතාවට යම් පැහැදිලි කිරීමක් කළා. නගරාධිපතිතුමනි, මේ කටයුත්ත කරද්දි අර සන්නිවේදනයේ දුර්වලතාවය නිසා තමයි මේ ගැටළු මතු වෙන්නේ. ඒක නිසා ජනතාවගේ කසළ ලබා ගැනීමේ වගකීම සභාවට තියෙනවා. ඒකනිසා ඒක කරද්දි ජනතාවට ප්‍රශ්නයක් නොවන විදිහට සහ සභාවටත් මේකේ ගැටළුවක් නොවන විදියට මේක සමබරව කර ගන්න පුළුවන් නම් තමයි මේ කටයුත්ත සාර්ථක කර ගන්න පුළුවන්. අනිවාර්යයෙන්ම අපි ප්‍රතිචක්‍රීකරණ ක්‍රියාවලියකට යන්න ඕනෑ එහෙම නැත්නම් අපිට උත්තර නෑ. ඒක අපි පිළිගන්නවා. නමුත්, ඒක සිදුකිරීමේදී ජනතාවට වඩ වඩාත් මෙහි බර පැට වෙනවා නම් ඒක සාර්ථක වෙන්නේ නෑ. මොකද අවසානයට සිද්ධ වෙන්නේ ජනතාව ඊට අනුගත වෙන්නේ නෑ. තැන තැන කුණු දාලා නැවත ප්‍රශ්නයක් මතු වෙන්න පුළුවන්. මේක පැහැදිලි කිරීමේදී විශේෂයෙන් කුණු අදින අය අපේ සේවක මහතුන් ලවා ඒ පණියුඩය යවනවාට වඩා ඒක නිසි ක්‍රමවේදයකට කරමු කියන ඉල්ලීම. එතුමා සමග සාකච්ඡාවක් කරා. පුළුවන් නම් ඔබතුමාත් සම්බන්ධ වෙලා විශේෂයෙන්ම මහල් නිවාසවල අයට අපි යම් සාකච්ඡාවක් කැඳවලා ඒ අයට කරුණු අවබෝධ කරලා. එක පාරටම මිනිස්සු අනුගත වෙන්නේ නෑ. ඔබතුමාට මතක ඇති මීට කළිනුත් අපි ප්ලාස්ටික් වර්ග වර්ගීකරණය කිරීමේදී මතුවෙච්ච ගැටළුව. සොයිසාපුර වගේ ප්‍රදේශයකදී සතියකට එක දවසයි ප්ලාස්ටික් ගෙනිච්චේ. එකෙදී ඒ අය

මේ දේවල් බොහොම අමාරුවෙන් තමයි, ගෙවල්වල තියන් හිටියේ. දිරන කසළවල පවා ප්‍රශ්න තියනවා. ඒ අය යම් ප්‍රමාණයකට ඒකට අනුගත වෙමින් ඒකට සහයෝගය දක්වමින් ආවා. ඒ එනකොට නැවත වතාවක් වෙනත් ක්‍රමවේදයකට නැවත ඒ අයට පණිවිඩයක් ලැබෙනවා. මේක අර එකපාරටම මිනිස්සුන්ට අනුගත වෙන්න බෑ නගරාධිපතිතුමකි. ඒකනිසා යම් ප්‍රමාණයකට ජනතාව සහයෝගය දැක්වනවා නම් ඒ අයගේ සහයෝගය ගන්න වෙන්නේ ඉතාම සුහදශිලීව ඒ අයට හරියටම මේ කරුණු අවබෝධ කරලා දීලා. ඒ අයට වඩාත් පහසු ලෙසට මෙය කර ගන්න පුළුවන් ක්‍රමවේදයක් ඇතුළේ. ඒකට යම් මැදිහත්වීමක් කරන්න කියලා ඉල්ලීම් කරනවා.

<u>නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

සුදේශ් මන්ත්‍රීතුමා, ඔබතුමාට පහසුවීම සඳහා තමයි මේ කථා කරන්නේ. මේ වැඩසටහනෙන් සෑම දිනකම මට මේ ගොඩනැගිල්ල දැන් කඩාගෙන වැටෙයි කියන බය ඉංජිනේරු දෙපාර්තමේන්තුව කියන නිසා, ඉක්මනින්ම මේ කියපු ගමන් මේක කරනවා. සතියකට තුන් පාරක් අනිවාර්යයෙන්ම පොලිතින්, කාඩ්බෝඩ්, ඉවතදාන කොළ වර්ග, රිජිෆෝම්, ඒ වගේම හම් මේ ඔක්කෝම දේවල් සතියකට තුන් පාරක් අදින වැඩසටහනක් මේ හදලා තියෙන්නේ. අපිට මේක කෙරුවට පස්සේ මාසයක් විතර යනකොට මිනිස්සු ස්තූති කරයි. අනිවාර්යයෙන්ම මේක මම කරනවා. මේ මොරටුවේ මිනිස්සු තමයි ලංකාවේ නෙමෙයි දකුණු ආසියාවේම ආදර්ශමත් මිනිස්සු ඉන්නේ කොටසක්. මේ මිනිස්සු මේක නොකර ඉන්නේ නෑ. මේ මිනිස්සු මේක කරනවා. ඒ විතරක් නෙමේ අපිට පුළුවන්කම ලැබෙනවා හැමදාම කිලෝ 200 යි එක වාහනයකින් ගේන්න අපි කියලා තියෙන්නේ. නැත්නම් බෙල් කර ගන්න වෙන්නේ නෑ. ඒක නිසා ඔබතුමාගෙන් සාධාරණයක් මිනිස්සුන්ට වෙයි. සෑම දිනම, දවස් 07 ම අපි අදිනවා පොලිතින් මේක ඉතාම සාර්ථක වැඩසටහනක්. මේක කරන්න පොඩි ප්‍රමාදයක් තියෙන්නේ මේ ගොඩනැගිලිවල. මේක කරාට පස්සේ මිනිස්සුන්ට තේරෙයි අනේ මොනතරම් පහසුවක්ද මේ කියලා. මට කර ගන්න පොඩි කාලයක් විතරයි ඕනේ. මේක කරලා අපිට අත්දැකීමුත් තියෙනවා. අනිවාර්යයෙන්ම කරපු නගර සභාවක් පාලකයෝ ටිකක් ඉන්න නිසා මේක අපහසුවක් වෙන්නේ නෑ. ඔබතුමාට කියන්නේ අනිවාර්යයෙන්ම අපි මේක කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, කරන්න එපා කියන අදහස නෙමෙයි අපි මේ කියන්නේ. මෙය කරද්දී ජනතාවටත් මේ පිළිබඳව අවබෝධය දීලා මිනිස්සු තේරුම් ගනිද්දි,

<u>නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු සුදේශ් මන්ත්‍රීතුමා, අපි කොළ වලින් බෙදලා දීලා තියෙන්නේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේ කසළ අදින සේවක මහතුන් විසින් කියන කාරණයක් තියෙනවා. ඒ අය කියන්නේ සේදුවේ නැත්නම් ගන්නේ නෑ. අන්න එහෙම ගැටළුවක් තියෙන්නේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - එච්. ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා</u>

සමාවෙන්න මන්ත්‍රීතුමා, සේවක මහතුන් කියනවා නෙමේ ඒගොල්ලෝ අතේ පත්‍රිකාවක් හැම ගෙදරකටම දීලා තියනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, හැම ගෙදරකටම ගිහිල්ලා නෑ. හැම ගෙදරකටම ගිහිල්ලා නෑ. සමහර ස්ථාන වලට ගිහිල්ලා නෑ. සමහර අයට ගිහිල්ලා තියනවා.

**03(08)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, තව පැමිණිල්ලක් කරන්න තියෙනවා. දැන් අපි දන්නවා කවුරුත් අපේ සභාවේ කිසියම් ව්‍යාපෘතියක් කිසියම් සංවර්ධන කටයුත්තක් සිද්ධ වෙනවා නම් ඒ කටයුත්ත පිළිබඳව සොයා බැලීම, ඒ කටයුත්තේ අඩුපාඩුකම් තියෙනවානම් ඒවා පෙන්වාදීම, ඒ පිළිබඳ පරීක්ෂා කිරීමේ පූර්ණ අයිතියක් සහ බලයක් මේ සෑම මහජන නියෝජිතයෙකුටම තියෙනවා. එතකොට ගරු නගරාධිපතිතුමනි, මේ පැමිණිල්ල ඇත්තටම මට කරන්න සිද්ධ වෙන්නෙත් විත්තියේ පාර්ශවයට නමුත්, මම මේක අදහසක් ලෙස ප්‍රකාශ කරන්න කැමතියි. මොකද මන්ත්‍රීවරයෙකුට යම් නිශ්චිත ප්‍රදේශයක සංවර්ධන කටයුත්තක් පිළිබඳ ගැටළුවක්, ප්‍රශ්නයක් මතු වුණාම ඒ ප්‍රශ්නය පිළිබඳ මුලින්ම සාකච්ඡා කරන්න වෙන්නේ අදාළ නිලධාරින් සමඟ. ඒ සාකච්ඡාව ඇතුළේ අවශ්‍යනම් ඒවා පරීක්ෂා කරන්න, අදාළ ස්ථාන වලට යන්න, ඒ ලිපිගොනු පරීක්ෂා කරන්න කොමසාරිස්තුමත් එක්ක ඒ අයගේ අනුදැනුම මත සම්බන්ධවෙලා මේ ගැටළුව නිරාකරණය කර ගන්න මැදිහත් වෙන්න අපට අයිතිය තියෙනවා. හැබැයි, එහෙම තිබ්බච අවස්ථාවකදී, යම් නිශ්චිත මොහොතකදී ගිය සතියේ සොයිසාපුර ප්‍රදේශයේ මාර්ග දෙකක් පිළිබඳව මට පැන නැගුණු ගැටළුව පිළිබඳව මම සාකච්ඡා කරලා. ඒ අයගේ අවබෝධය සහිතව කොමසාරිස්තුමාගේ අනුදැනුම සහිතව අදාළ තාක්ෂණ නිලධාරි මහත්තයත් එක්ක ඒ ස්ථානයට යන්න සූදානම් වුණා. ඒ ගැටළුව යම් ප්‍රමාණයකට පැටලැවිල්ල ලිහා ගන්න. එතුමා කියපු කාරණයත් මම කියපු කාරණයත් එතුමාගේ පැත්තෙන්ම තමයි ආවේ අපි ගිහිල්ලා එහෙනම් ස්ථානයට යමු කියලා. නමුත්, අවසනාවන්තකම කියලා කියන්නේ, ඔබතුමා ඒ මොහොතෙම එතුමට දුරථකයෙන් කථා කරලා ඒ ගමන වැළැක්වුවා. ඒක සාධාරණ නෑ ගරු නගරාධිපතිතුමනි, මොකද නිලධාරියෙක් එක්ක අපට ගණුදෙණු කරන්න, අපට සාකච්ඡා කරන්න, අපට ප්‍රශ්න කිරීමේ පූර්ණ අයිතිය තියෙනවා. ඒක නිසා ඒ අයිතිය උදුර ගන්න අපට ඉඩ දෙන්න බෑ. ඔබතුමාගෙන් විශේෂයෙන් ඉල්ලා සිටිනවා.

<u>නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමනි, බාධා කිරීමක් කළා නෙමේ ඔබතුමා යන එකට. නියෝජ්‍ය නගරාධිපතිතුමත්, මම ඇතුළු නගර සභාවේ විපක්ෂ නායකතුමා ඇතුළු තව කාටවත් මේ ප්‍රශ්නේ බලපාලා තියෙන්න පුළුවන්. යම්කිසි කාල පරාසයක අපි ඉන්නේ. අපේ සභාව තුළ ගම්පෙරළිය කරපු විදියටම නෙමෙයි මේ ව්‍යාපෘති ටික කරන්න තියෙන්නේ. ගම්පෙරළියේ කටයුතු කරද්දි නිලධාරින් ඒ කටයුතු කරපු ආකාරයත්, ඒ වගේම මොකකටවත් අතවත් තියන්නේ නැතිව වැඩ භාගෙට කරලා, කාලට කරලා, වැඩ ඉතුරු කරලා  සල්ලි ගෙවපු විදියට නෙමෙයි ගෙවන්න යන්නේ. වැඩේ කරලා ඉවර වෙලා ෆොටෝ එකක් ගහන්න ඕනෑ. මේ මාසේ 12 වෙනිදායින් ඉස්සෙල්ලා දෙන්න ඕනෑ. අපි සැලසුමක් ඉදිරිපත් කළාම ඒ කාර්යයට යන්න දුන්නේ නෑ. පස්සේ  ලොකු ප්‍රශ්නයක් අපට තියෙනවා. ලක්ෂ 840 ක් අපට එවලා තියෙනවා. ලක්ෂ 840 න් ලක්ෂ 600 කට වැඩිය ගන්න තියෙනවා බිල්පත් ඉදිරිපත් කරලා. එතකොට ඕක සාකච්ඡාවට අරගෙන ෆයිල් අරගෙන නිලධාරින් එක්ක ඉවර කරන්න ඕන  ප්‍රශ්නයක්. තාක්ෂණ නිලධාරියෙක් සමඟ මේක සාකච්ඡා

කරන්න ඕනෑ විදියක් තියෙනවා. ක්‍රමයක් තියෙනවා. නිලධාරියෙක් අරගෙන යනවට වඩා ලිපිගොනු තියෙනවා පරීක්ෂා කරන්න. ඒ ඇරෙන්න මන්ත්‍රීවරයෙක් වුණ පළියට පරිපාලනයට විරුද්ධව කටයුතු කරනවානම් ඒක නැවැත්වීමට මට අයිතියක් නැත්නම් මම නගරාධිපතිවරයෙක් වෙන්න ඕන නෑ. මම ප්‍රධානියා වෙන්න ඕන වෙන්නෙත් නෑ. කෙනෙක්ව පත් කරන්න ඕනෙත් නෑ එහෙම කියලා. ඒ වෙලාවේ ගන්න ඕනෑ සල්ලි ප්‍රමාණය වැඩි නිසා. තාක්ෂණ නිලධාරියෙකුට නිවාඩුත් නෑ. මම කාලසටහනක් හදලා තියෙන්නේ. අද මේ ව්‍යාපෘතිය මේ තාක්ෂණ නිලධාරි ගියාද නැද්ද, ස්ථාන ශුද්ධ කළාද නැද්ද, ගල් ගෙනාවද නැද්ද, දැන් කාපට් අදියරේද තියෙන්නේ කොච්චරක් කරලද, දවසින් දවසට කරලා තමයි මේ තරම් දුරට මේක ගෙනාවේ. ඒ අතරතුරේදී මේ පාරද කරලා තියෙන්නේ. මේ වගේ සරල කාරණයකට තාක්ෂණ නිලධාරියෙකු ඇදගෙන ගිහින් පැය 02 ක් 03 ක් මිඩංගු කරන්න දෙන්න බෑ. ඒ ඇරෙන්න මේ කරපු පළවෙනි එක. මගෙන් ආයෙත් මේක නොවෙන්නත් පුළුවන්. මට ඊට වඩා වගකීමක් තියෙනවා. මේ ආණ්ඩුවේ සල්ලි එච්චට පස්සේ. සේනක දමයන්ත මැතිතුමා එතුමා පළාත් සභා මන්ත්‍රී වෙලා ඉන්න කොට මම අනන්තවත් කියලා ඇති. මම ඔබතුමාට කියලා ඇති ඔබතුමා කුමන හෝ ආකාරයකින් කරන්න.මම ඔබතුමාට උදව් කරනවා වැඩ කරන්න කියලා. ඒක නිසා මම ඒකට එකඟ නෑ. බලහත්කාර කමක් නෙමේ කළේ. ඊට වඩා යම්කිසි කාරණයක් කිරීමට මගේ තියෙන වගකීම. ඔබතුමාම කියනවානේ යම්කිසි දේවල් වගකීමෙන් කරන්න ඕනෑ කියලා. එතකොට ඒ ලක්ෂ 840 ඒකට මම වගකියන්න ඕන නැතිද? ඒක නිසා සභාවෙන් කරපු දේවල් වලට අපිට ඕන වෙලාවක ගෙවන්න පුළුවන්. සපිරි ගම වැඩසටහනේ, මේ 12 වෙනිදා වෙනකොට බිල්පත් ඉදිරිපත් කළේ නැතිනම් සල්ලි ලැබෙන්නේ නෑ. සමාවෙන්න ඕනෑ. ඒ ඇරෙන්නට වෙන නරක චේතනාවකින්වත් ඔබතුමාලා සමග ගණුදෙණු කරන්නේ. යම්කිසි කාලයක අපි විපක්ෂයේ ඉඳලා අත්දුටු, අත්විඳි දේවල් අපි ඔබලට දීලා නෑ. අපි එහෙම දෙන්න උත්සහ ගන්නේ නෑ.

**03(09)** <u>**මහා නගර සභා මන්ත්‍රී - එම්. සුනිල් නන්දසිරි මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, රාවතාවත්ත කනත්තේ සේවකයෝ 17 ක් ඉන්නවා. ඔබතුමා දන්නවා. මේක හැමදාම තියෙන ප්‍රශ්නයක්. මේක අපි කවුරුත් දන්නවා. ගිය සඳුදා මාත් තිලකසිරි මන්ත්‍රීතුමත් හිටියා. එදා මරණවල් දෙකක වලවල් කපන්න තිබුණා. නමුත්, එක උදැල්ලයි තිබුණේ, එක සවලයි කැඩිච්ච එකක්. ඒ වේලාවේම කථා කළා කොමසාරිස්තුමාට. එතුමාට ස්තූතිවන්ත වෙනවා එවේලාවේම ඒක ලෑස්ති කරලා දුන්නා. ප්‍රධාන මහජන පරීක්ෂකතුමාටත් මම ස්තූතිවන්ත වෙනවා. තව ඉල්ලීමක් තියෙනවා, නගරාධිපතිතුමනි, පියුමාල්ලාට තියෙන්නේ අතිකාල පැය 80 යි. සෑම මසකම අන්තිමේට අමතර අතිකාල ඉල්ලීම් කරනවා. ඒකනිසා ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. මෙහි ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමාත් සටහනක් දාලා තියෙනවා. මේක සත්‍ය කථාවක් හින්දා. රාවතාවත්ත කනත්ත මහා ප්‍රහල කනත්තක්. මරණ වැඩි කනත්තක්. මේ පිළිබඳව සානුකම්පිතව සලකා බලලා. පැය 100 ලබා දෙන ලෙස ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

**03(10)** <u>**මහා නගර සභා මන්ත්‍රී - එම්. සුනිල් නන්දසිරි මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, මම පොදු ඉල්ලීමක් කරනවා හැමෝගෙන්ම. ඔබතුමාගෙන් පුළුවන්නම් මේ චේම්බර් එක කැමරා සවි කරන්න කියලා. මට ලොකු අකරතැබ්බක් වුණා ගිය මාසේ සභාවේදී. ධනුෂ්ක ප්‍රනාන්දු, අපේ අලි ගෙදර ළමයාගේ මෝල්ලේ ඩොකියුමන්ට්ස් දෙකයි, ගිනි නිවන බිලයි, සභාවේ බිලයි ඒ සහතික දෙකයි මම එදාම ආරච්චිලා මහත්තයාගෙන් හම්බවෙච්ච මුදල් කම්ටු ඒ කවරෙම තමයි දැම්මේ. මගේ නමත් තියෙනවා. ඒ දෙක දාලා රුපියල් 3,000.00 ක

මුදල් දාගේ කොළ තුනක් එක්ක දාලා මෙතන තියලා කොහොම හරි මම අමතක වෙලා, ඔබතුමාගේ කාර්යාලයට ගියා විතරයි. නමුත්, ඇවිල්ලා බලනකොට, මට රුපියල් 3,000.00 නැතත් කමක් නෑ. ඒ දේ ලැබුණානම්. මම මේ මේක කියන්නේ ඒ මනුස්සයා නැත්නම් හිතයි මම මේක කරේ නෑ කියලා. ධනුෂ්ක ප්‍රනාන්දු නො. 42, ඒ මෝල්ලේ අදාළ ඩොකියුමන්ට්ස් නෑ. මාසේ තියෙන නිසා අවශ්‍ය වෙන්නේ නෑ. නැවත එකක් ලබා ගන්න. මම මේක කියන්නේ මොකක්වත් නිසා නෙමෙයි. අනුකූල සහතිකේ ගන්න ඕනෑ හින්දයි. එයාට මොකක් හරි දෙන්න වුණොත් එහෙම. රුපියල් 3,000.00 ක් දාගේ කොළ තුනක් සමඟ රුපියල් 3,000.00 ක් නැති වුණා. මම කණගාටුවෙනවා. මේ වගේ තැනක සභාවක මෙහෙම දෙයක් වෙච්ච එක ගැන.

**03(11)** **<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. නාලනී ප්‍රේමවතී ප්‍රනාන්දු මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, මම මේ අවස්ථාවේදී විශේෂ ස්තුතියක් කරන්න සූදානම් වෙන්නේ. මට පොඩ්ඩක් කාලය දෙන්න. අද මේ මුළු ලොවම අඩවන කොවිඩ් වසංගතය හේතුවෙන් මා නියෝජනය කරන අඟුලාන ග්‍රාමය පසුගිය සති කිහිපය තුළ හුදකලාවට ලක් වුණා. ඒක මෙහෙම සිද්ධ වුණේ, ඔබතුමා දන්නවා ඇති පෑලියගොඩ මත්ස්‍ය වෙළඳාම නිසාත්, වෙළඳාම් කරන මහත්ම, මහත්මීන්ගෙනුත්, ඒ වගේම මෙම රෝගය පිළිබඳ දැනුමක් නැති උදවියගෙන් මේක ව්‍යාප්ත වෙලා ගියා. මේ නිසා අඟුලාන සම්පූර්ණයෙන්ම වසා දැම්මා. සයුරපුර තමයි වැඩි වශයෙන්ම මේ කොරෝනා වෛරසයට හේතු සාධක වුණේ. ඉතිං ඇත්තටම ඒ අවස්ථාවේදී, මම දුටුවා, මට දුරකථනයෙන් කථා කරලා ගරු ඔබතුමා, කොමසාරිස්තුමා ඇතුළු ලේකම්තුමන්ලා, නිලධාරි මණ්ඩලය සමඟ සෞඛ්‍ය අංශයේ නිලධාරින් සමඟ සාකච්ඡා පවත්වමින්, සෑම ආයතනයක්ම කැඳවමින් කරපු සේවාව ඉතාමත්ම වැදගත්. ඉතාමත්ම ආකර්ෂණීයයි. මෙතරම් ඉක්මනට හුදකලාභාවය ඉවත් කිරීමටත්, ඒ සෞඛ්‍ය පහසුකම් දැන උගත් කර ගනිමින් ජනතාව ඒ අනුව කටයුතු කරන්න සූදානම් වෙලා ඉක්මනින් ඒ කටයුතු සලසා දුන්නට. ඔබතුමාට විශේෂ ස්තුතියක් කරන්න ඕනෑ. ඔබතුමා සෑහෙන්න කැපවීමක් කරනවා. අඟුලාන විතරක් නෙමේ මුළු මොරටුවටම. ඔබතුමා දිවා රෑ නොබලා, ඔබතුමා කරපු සේවය වෛද්‍ය උපදෙස්, වෛද්‍ය සායන, ඒ වගේම නිරෝධායනය කරපු අයට ආහාරපාන ලැබුණද? ඒවාදීම පිළිබඳ සෑහෙන උපකාර කළා. මගේ ගෞරවය ඔබතුමාටත්, නාගරික කොමසාරිස්තුමාටත්, ලේකම්තුමාටත් ඇතුළු සියලුම නිලධාරි මහත්ම, මහත්මීන්ටත්ටත්, මාගේ ගෞරවය, ප්‍රණාමය පුද කරන අතර, අඟුලාන උතුර, දකුණ ග්‍රාම නිලධාරි මහත්වරුන්ටත්, උපුල් මහත්මයා අඟුලාන උතුර, ප්‍රියංජිත් මහත්මයා අඟුලාන දකුණ ඒ දෙපල ඉතාමත් කැපවීමෙන් කටයුතු කළා. ඒ දෙපල තමන්ගේ නිවාස වලට යන්නේ නැතිව දිවා රෑ නොබලා ඒ සේවය ඉමහත් ලෙස කටයුතු කරමින් ඒ ජනතාව සුරක්ෂිත කරන්නට, ජනතාවට ආහාර පාන ලබාදීමට, කටයුතු කළේ. මොරටුව ප්‍රාදේශී ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම්තුමා, සහකාර ප්‍රාදේශීය ලේකම්තුමිය ඇතුළු නිලධාරි මණ්ඩලය මහත්ම, මහත්මීන්, මම දුටුවා ඔබතුමාත් ඒ අවස්ථාවන්හීදි සම්බන්ධ වුණා. කැපවීමෙන් මාක්ස් දෙකක් දාගෙන වැඩ කළේ. සයුරුපුර නිරෝධායනය කරලා තිබුණු අවස්ථාවේදී, කිහිප විටක්ම සමිති සමාගම් පවත්වමින් ඒ අය සතුටු කිරීමටත්, ඒ අයගේ මනස යහපත් කිරීමටත්, සෞඛ්‍ය නීති රීති පැහැදිලි කිරීමටත්, ඔබතුමා සෑහෙන්න කටයුතු කළා. ඒ සම්බන්ධයෙන් ස්තුතිය පුද කරනවා. කොළඹ, බස්නාහිර පළාත භාර පොලිස්පති දේශබන්ධු තෙන්නකෝන් මහතා, ඒ වගේම අඟුලාන පොලිසියේ පොලිස් පරීක්ෂකතුමන්, සාරද මහත්මයා, ඒ වගේම කොළඹ දිසාපතිතුමා ඇතුළු සියලුදෙනා පැමිණිලා සයුරුපුර ජනතාව වෙනුවෙන් ඒ සියලු කටයුතු ආහාරපාන බෙදා දෙමින් ඒ සියලු කටයුතු සම්පාදනය කිරීම පිළිබඳව මාගේ ස්තූතිය ඒ සියලු දෙනාටම පුද කර සිටිනවා.

මට අද කණගාටුදායක දවසක්. මම ඒක කියන්න ඕනෑ ඔබතුමත් දන්නවා ඇති, මේ අවුරුදු 17 ක් විපක්ෂ නායක වෙලා හිටපු පළාත් සභා මන්ත්‍රී, දිවංගත මගේ සහෝදරයා දිවංගත වූ දිනය අද තමයි. එතුමාව මම මේ අවස්ථාවේදී සිහිපත් කරන අතර, එතුමා වෙනුවෙන් එතුමන්ගේ පුතණුවන් දානමය පිංකමක් ලෑස්ති කරලා තිබුණා මම ඒකටත් සම්බන්ධ වෙලා තමයි ආවේ. ඉතිං මම එතුමාව මේ අවස්ථාවේදී සිහිපත් කරනවා. අපි කරන පුණ්‍ය කටයුතු එතුමාට ලැබීමෙන් එතුමාගේ පරලොව ජීවිතය ආලෝමත් වේවා කියලා ප්‍රාර්ථනා කරනවා.

**03(12)** <u>**මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, විශේෂයෙන් මොරටුවේ රිමාන්ඩ් ගතවෙලා සිටින රැඳවියන් PCR නොකර මොරටුවට නැවතත් නිදහස් වෙලා එන අවස්ථාවේදී, PCR නොකිරීම නිසා මොරටුවේ සමහර ප්‍රදේශවල ජනතාවට නිවස තුළ රිමාන්ඩ් වෙන්න සිද්ද වෙනවා. නිවස තුළ නිරෝධායනය වෙන්න සිද්ධ වෙලා තියෙනවා. පහුගිය කාලේදී මොරටුවැල්ල ප්‍රදේශයේද රැඳවියෙක් නිදහස් වෙලා ආවා. හැබැයි, PCR වලට අහුවෙලා තිබුණේ නෑ. PCR කරලා තිබුණෙත් නෑ. මොනවා හරි ක්‍රමවේදයක් හදන්න ඕණෑ ගරු නගරාධිපතිතුමනි, රිමාන්ඩ් වෙලා නිදහස් වලා එන අයව PCR කරන්න හෝ ඒ සම්බන්ධයෙන් දැඩි ප්‍රශ්නයක් තියෙනවා. ඊයේ පෙරේදාත් රැඳවියෙක් නිරෝධානය නොවී ඇවිත් තියෙනවා. ඔහු නිසාත් නිරෝධානය වෙන්න වෙලා තියෙනවා පිරිසට. ඒ නිසා PCR කරලා හෝ නොකර හෝ මම හිතන්නේ නොකර එන රැඳවියන් නිසා ජනතාවට නිරෝධායනය වෙන්න සිද්ද වෙනවා නම් ඒකේ ප්‍රශ්නයක් තියෙනවා. ඒ නිසා බ්‍රැන්ඩෙක්ස් පොකුර හෝ මාළු මාර්කට් එකේ පොකුර වගේ රිමාන්ඩ් පොකුරකුත් හැදෙන්න පුළුවන් මොරටුවේ. ඒ සඳහා අවධානය යොමු කරනවා. ඒ සම්බන්ධයෙන් බලධාරින්ගේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා. රැඳවියෙක් නිදහස් වෙලා එනවා නම් එක්කෝ PCR කරලා එවන්න ඕනෑ, නැත්නම් මොරටුවත්, මුළු ලංකාවත් 3 වන මට්ටමේදී දැඩි අවධානම් තත්ත්වයක තියෙනවා ගරු නගරාධිපතිතුමනි, ඒත් එක්කම ගරු නගරාධිපතිතුමනි, මොරටුව මහා නගර සභාව තුළ සිද්ද වෙච්ච ක්‍රියාදාමය අතර අපිත් මතක් කළා, ඔබතුමත් ඒකට එකඟ වුණා. මොරටුව මහා නගර සභාවේ සේවකයින්ට කොරෝනා නිසා. අපි හැමෝටම ප්‍රශ්න තියෙනවා. ආර්ථික අපහසුතා තියෙනවා. රැකියාව කර ගන්න බැරි ප්‍රශ්නයක් තියෙනවා. ඒකත් එක්ක ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා එකඟ වුණා රුපියල් 15,000/- බඩු මල්ලක් ලබා දෙන්න. අපිට තියෙන ආර්ථික ප්‍රශ්නත් එක්ක ඒක කළමනාකරණය කර ගැනීමේ ප්‍රශ්න තියෙන්න පුළුවන්. ඒත් එක්කම අපි හැමෝම මේ උත්සව සමයේදී උත්සව අත්තිකාරම් ලබා ගැනීමේ බලාපොරොත්තුවෙන් ඉන්නවා. ගරු නගරාධිපතිතුමනි, මම ඔබතුමාගගෙන් යම් දැන ගැනීමක් කරන්න කැමතියි. අද දවසේදී මම දැනුවත්වීම හරිද වැරදිද දන්නෑ මාව නිවැරදි කරන්න. මොරටුව මහා නගර සභාව තුළ තිබෙන කසළ රථ කම්පැක්ට්, අනෙක් රථ යම් ප්‍රදේශයකට, බණ්ඩාරගම ප්‍රදේශයට හෝ ගෙනියන්න යම් උත්සහයක් තියෙනවා අද දවසේදී.

<u>**නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමා, උත්සහයක් නොවේ අනිවාර්යයෙන්ම ඒක සිදු කරනවා. අපේ කොන්ත්‍රාත්කරුවෙකු ලෙස ලියාපදිංචි වෙලා තියෙන කසුන් මහත්මයාට අයත් ඉඩම, තෙත් බිමක් නොවන අක්කර 05 ක ඔහුගේ මවට අයත්ව තියෙන අක්කර 05 ක ඩික්සන් පීරිස්

ක්‍රීඩාංගනය ඔබතුමන්ලාලේ සංවර්ධනය ව්‍යාපෘතිය සිදු කරපු ඒ පස් ටික, එතුමාගේ සම්පූර්ණ මැදිහත්වීම තුළ මව්ගේ ගෙදර අක්කර 05 ක් තියෙනවා. මතුපිට පිහිටි ඉඩමක් දාන එක අද දවසේ සිදු කළා. මම හිතනවා දිගින් දිගටම එතුමා අපට ඉවතලන පස් දාන්න අවසර දීලා තියෙනවා. මගෙන් පිළියන්දල පැත්තේනුත් කට්ටිය විමසුවා. ඔව්. අපි දාන්නේ, අපිට අවසරලත් ඉඩමකට කියලා.

**03(13)** <u>**මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, ඊළඟ කාරණය තමයි. කසළ කළමනාකරණ වැඩසටහන යටතේ ලැබිච්ච ක්‍රියාදාමය ඉතා හොදයි. ඒක අපි යුහුසුළුව ඉක්මනින් කළයුතු කාරණයක්. කසළ වෙන්කිරීම සම්බන්ධයෙන් මොරටුවේ මිනිස්සුන්ට ලැබෙන්න ඕනෑ ගෞරවය පිළිබඳව ඔබතුමා මතක් කළා. ඒක එසේමයි. මොකද අපි ආදර්ශය කසළ වෙන් කිරිම අතින් අපි ආදර්ශයක් ප්‍රමුඛස්ථානයක් ලබාදීලා කරලා තියෙනවා. ඒකත් එක්ක විශේෂයෙන් කසළ බෙල් කිරීමේ ක්‍රමයත් එක්ක ගනිද්දි එක්තරා අවස්ථාවකදී මට කුලියාපිටියට යන්න හම්බ වුණා දවස් කිහිපයකට. NVQ පාඨමාලාවක් කරපු නිසා මේ කසළ සම්බන්ධව. විශේෂයෙන්ම මම හිතන්නේ කසළ වෙන් කිරිමේ ප්‍රශ්න තිබුණත්, ඒ ආදර්ශයෙනුත් ඔබතුමා නිරීක්ෂණය කරනවා නම් හොඳයි. ඊළඟ කාරණය තමයි නගරාධිපතිතුමනි, NCP ආයතනය, හොල්සිම් ආයතනයට අපි මේ ටික ගෙන යන අතරවාරයේදී, තවත් විකල්ප අපට තියෙනවා. එම විකල්ප වලට ඕන කරන දොර ඇරගැනීමත් ඉතාමත් වැදගත්. ඒ සඳහා ඔබතුමාගේ අවධානයත් මීට මාස කිහිපයකට පෙර යොමු කරා. අපිට ඉතාමත් හොද කාර්යය භාරයක් මේ හොල්සිම් එකට යන එක හා Zero Waste කියන කන්සෙප්ට් එක කසළ සම්පතක් බවට පත් කර ගන්න ක්‍රමය ඉතාම හොද කාර්යයක්. ඒත් එක්කම ගරු නගරාධිපතිතුමනි, ඒ කිව්ව විදියට දැනුවත් කිරීමේ ක්‍රමවේදයක් මීට වඩා හොඳින් යන්න ඕනෑ. වැඩේ හොඳයි. අවබෝධ කර ගැනීමේ මේ ක්‍රමය මොකක්ද. මේ පිළිබඳව මටත් ලීෆ්ලට් එකක් හම්බ වුණා. අවධානය මෙච්චර කල් යොමු නොකරපු පසුගිය කාලේදී මේ E -Waste කියන එක. මේ E - Waste කියන එක ලොකු ප්‍රශ්නයක්. පසුගිය දිනවල ඇත්තටම මේක එකතු කළේ තැපැල් කන්තෝරුවෙන්. ඇත්තටම මටත් ප්‍රශ්නයක් තිබුණා, නගර සභාව තියෙද්දී තැපැල් තක්තෝරුවෙන් E - Waste එකතු කළේ ඇයි කියලා. ඒකට අපි යොමු වෙලා තියෙනවා. ඒක හොඳ වැඩක් ඒක නිසා ගරු නගරාධිපතිතුමනි, අපට තැන් තැන්වල දොරවල් තියෙනවා. මේ වෙන කොට කෙළවර පිටියේ කසළ විදුලි බලාගාරය ක්‍රමිෂන් කරලා ඉවරයි. පසුගියදා ආරම්භ කරපු සුළං බලාගාරයත් එක්කම තමයි පටන් ගත්තේ 2018 වර්ෂයේ. ඒකට ඕන කරන කාරණය ඒක කමිෂන් කරලා මාස 03 ක් විතර තියෙනවා. ඒකට අවශ්‍ය කරන මහා නගර අමාත්‍යාංශය දැන් තියෙන්නේ, මහින්ද මහත්තයාගේ යටතේ. ඒ නිසා එකේ වැඩ කටයුතු දැන් අවසන්. ඒකටත් අපිට කරන්න පුළුවන් උනොත් එහෙම අපිට ප්‍රවාහන පිරිවැය අඩු කර ගැනීමේ කාරණාවකුත් තියෙනවා. ඒ නිසා අවශ්‍ය කාරණයත් අපි නගර සභාව පැත්තෙන් කරලා කසළ බලාගාරයක් ඒ අවශ්‍ය කරන කාරණයත් අපි කරන්න ඕන. 2 වන අදියර යටතේ අපි මෙතන ආරම්භ කළා. ඒක යම් ප්‍රාථමික මට්ටමක තමයි තියෙන්නේ, ඒකත් ඉක්මනින් ඉවර කරලා අපි මේ ප්‍රශ්නයට විසඳුමක් දෙන්න ඕනෑ. අපි නගර සභාවක් විදිහට ඒකට යොමු වුණාට වෙනත් නගර සභා පැත්තෙන් ගත්තම මේකට යොමු වෙලා නෑ. ඒ නිසා ඔබතුමාගේ අවධානය යොමු කරනවා හොල්සිම් එකට යන අතරවාරෙදී අනෙක් දොරටුත් විවර කර ගන්න. ඔබතුමාගේ කාර්ය භාරය කළා. අපේ පැත්තෙනුත් අපේ තියෙන ශක්තිය දායකත්වය අපි දෙන්න කැමතියි.

**03(14)** <u>මහා නගර සභා මන්ත්‍රී - යූ. ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ආයාචනා, පෙත්සම් හා පැමිණිලි යටතේ පැමිණිලි දෙකක් තියෙනවා නගරාධිපතිතුමනි ඉදිරිපත් කරන්න. මොරටුව විශ්ව විද්‍යාලය ඉදිරිපිට පැරණි මාතෘ හා ළමා සායනය පිළිබඳව. මීට කලින් යෝජනාවක් මා විසින් ඉදිරිපත් කළා. ඊට පසුව මත්ද්‍රව්‍ය පාවිච්චි කරන්නන්ගේ පාරාදීසයක් වෙලා කියලා මා විසින් දැනුවත් කළා. මා මහා සභාව දැනුවත් කරද්දි නාගරික කොමසාරිස්තුමා දන්වා සිටියා නිල නිවසක් බවට පත් කළ බවට. දැන් එම නිල නිවසේ, මහජනයා විසින් මා හට පැමිණිලි කරනවා. ව්‍යාපාර කටයුතු එම නිල නිවසේ සිදු වෙනවා කියලා. නිල නිවසේ ඉදිරිපිට. කරුණාකරලා, මොරටුව විශ්ව විද්‍යාලය ඉදිරිපිට තිබෙන නිල නිවසක් බවට පත් කරලා තියෙනවා. තැඹිලි, පොල් ඒ වගේ දේවල් විකුණන්න දැන් පටන් අරන් තියෙනවා. ඒවා තව තව දියුණු වෙයි කියලා සැකයක් තියෙනවා ජනතාවට. ඒ ගැන සොයා බලන ලෙස ඉල්ලනවා.

**03(15)** <u>මහා නගර සභා මන්ත්‍රී - යූ. ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඒ වගේම මට තවත් පැමිණිල්ලක් ලැබිලා තියෙනවා. චමිල රාජපක්ෂ, අංක 25, පොල්කොටුව පාර, මොරටුව. රජයට අයිතිව ඇති ඉඩමක කර ඇති අනවසර ඉදිකිරීමක් හේතුවෙන්, අවධානම් සහගත තත්ත්වයක් ඇතිවීම සම්බන්ධවයි. ස්ථානය මොරටුව, පොල්කොටුව පාරේ, අංක 25 ඉඩමට යාබද පර්චස් 02 ක් පමණ දක්වා විහිදෙන ජංගා වළට අයත් ප්‍රදේශය. මීට කලකට පෙර මාගේ ඉඩමට යාබදව තිබූ මෙම බිම් කොටස ඇළ මාර්ගයක් සහ වතුර වළකට සම්බන්ධ වී තිබුණි. මෙම බිම් කොටස හඳුන්වනු ලැබුවේ ජංගාවල යනුවෙනි. පසුකාලීනව මෙම ඉඩම ගොඩ වූ අතර, මෙම භූමි කොටස අප විසින්.

<u>නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ප්‍රසන්න මන්ත්‍රීතුමා, ඕක මිතිල කියලා කෙනෙක්ද එවලා තියෙන්නේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ. ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, චමිල රාජපක්ෂ

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ. ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා</u>

නිලධාරි කාර්යාලයක් ඉදිකිරීම සඳහා 1997 ප්‍රදේශයේ ග්‍රාම සේවක මහතාට මොරටුව මහා නගර සභාවට ලිඛිතව පවරා දෙන ලදි. පසුකාලීනව මෙම ස්ථානයට පැමිණි පවුලක් විසින් දැනට අවුරුදු 04 කට පෙර මෙම ඉඩම් කොටස ඔවුන්ට නගරාධිපතිතුමා විසින් ලබා දුන්නා යයි පවසමින් තාවකාලිකව පෙට්ටි කඩයක් ඉදි කරන ලද අතර, පසුව ඔවුන් විසින් තනි තට්ටුවේ නිවසක්ද ඉදි කරන ලදි. මෙම ඉඩම් කොටස නගර සභාවට අයත් බව කවුරුත් දන්නා කරුණකි. තවද, පර්චස් 02 ක් පමණ විහිදෙන භූමි ප්‍රමාණය ප්‍රධාන පාරකට මුහුණ ලා පවතින බැවින්, වාණිජ වටිනාකමද ඉතා ඉහළය. මේ වනවිට ඔවුන් තනි තට්ටුවේ නිවස, තට්ටු දෙක දක්වා වැඩි කිරීමට කටයුතු කරමින් සිටින අතර, මොවුන් මෙම ඉඩමට ඉදිරි පසින් ඇති පදික වේදිකාවද ගස් සිටුවමින් ඉතා නොමනා ලෙස අවහිර කර තිබේ. කරුණු මෙසේ වුවද, වගකිව යුතු බලධාරීන් විසින් මෙම අනවසර ඉදිකිරීම සම්බන්ධව කිසිදු පියවරක් අනුගමනය නොකොට නිහඬ පිළිවෙතක් අනුගමනය කරන බව පෙනේ. තවද, මා විසින් මෙය මෙපමණ හුවා දැක්වීමට හේතුව නම්, මෙම ඉඩමට යාබදව පිහිටා ඇති මාගේ නිවසට මෙම අනවසර ඉදිකිරීම හේතුවෙන් දැඩි

අලාභහානි සිදු වී තිබීමයි. මන්ද යත් මොවුන් විසින් මේ දිනවලදී තවදුරටත්, ඉදිකරමින් සිටින අනවසර ගොඩනැගිල්ල ගිලා බැසීමට ලක්වමින් සිටින බවද, ඉතා පැහැදිලිව පෙනේ. මීට අදාළ ඡායා පිටපත් කිහිපයක් ද මේ සමඟ අමුණා තිබේ.

<u>නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, මේ වෙනකොට ඔවුන්ව අපි මේ නගර සභාවට දෙපාරක් ගෙන්නලා ඔහුට කිවයුතු දේ කියලා තියෙන්නේ. අපිට දැන් තියෙන්නේ ගේ ඉවත් කිරීම පමණයි. අවසාන වශයෙන් ඔය කාණුව බ්ලොක්වීම නිසා රොලී ප්‍රනාන්දු මාවතේ සිට වතුර ප්‍රනාන්දු මාවත ඔක්කොම යටවෙලා තමයි මෙතැනට වතුර බහින්නේ. කරුණාකරලා ඉවත් කර ගන්නවද, ගේ කඩනවාද කියලා අපි අවසාන නිවේදනය යවලා තියෙන්නේ. මේ කටයුත්තට එතුමා අපේ ගෙදර ආවේ මුලින්ම. එතකොට මම කිව්වා මේක මගේ පුද්ගලික දෙයක් නෙමෙයි. සභාවට ඇවිල්ලා කරුණු ඉදිරිපත් කරන්න මුලින්ම. අපි අයිතිකරුවන්යැයි කියා ගන්නා අයව දෙපාරක් ගෙනල්ලා තියෙන්නේ. අවශ්‍ය කටයුතු කළා. එතුමට ජේන්නෑ, අවශ්‍ය කටයුතු කරනවා. එතුමා හිතන්නේ බලධාරින් නිහඬව ඉන්නවා කියලා මේ වෙනකොට දෙපාරක් ගෙන්නුවා තුන්වෙනි පාර කඩලා දාන එක විතරයි කරන්න තියෙන්නේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ. ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මම මේ ලිපිය සභාගත කරනවා. මම අවසාන වශයෙන් කියනවා මෙම ඉදිකිරීම නිසා දේපල හානි සිදුවෙමින් පවතින අතර, එයට ආරවුල් ඇති වී කාන්තාවකට පහරදීම සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක වෙලා නෑ. ලොකු ආරවුල් ඇති වෙනවා මේ නිසා.

<u>නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ඒවා අපිට අදාළ නෑ.

**03(16)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්ලිව්.පී. ප්‍රභාෂනි වික්‍රමසිංහ මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, මටත් තියෙනවා මේ අයිතමය යටතේ ඔබතුමාගෙන් ඉල්ලීමක් කරන්න. බොරුපන, සමන් මාවතේ අග කොටසේ ඉදි කරලා තියෙන කාණුවේ ගරු නගරාධිපතිතුමනි, වතුර බහින්න දාලා තියෙන්නේ ගොඩක් පුංචි බෝක්කු දෙකක්. මම කලිනුත් ඉල්ලීමක් කළා ඔබතුමාගෙන්, ලොකු බෝක්කුවක් දාලා කාණු දෙකම සම්බන්ධ කරලා වතුර බහින්න සලස්සලා දෙන්න කියලා. නමුත්, ඒ පිළිබඳව කිසිදු ක්‍රියාමාර්ගයක් ගත්තෙත් නෑ. යෝජනාවට ඇස්තමේන්තුවක් ඉදිරිපත් වුණා විතරයි. ඉතිං මේ වෙනකොට ඒ ජනතාව දැඩි අපහසුතාවයකට ලක් වෙලා තියෙනවා. මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා මේ පිළිබඳව සොයා බලලා සුදුසු ක්‍රියාමාර්ගයක් ගන්න කියලා. ඒ වගේම ගරු නගරාධිපතිතුමනි, මේ වෙනකොට ඒ ප්‍රදේශයේ විශාල මදුරු තර්ජනයක් තියෙනවා. මදුරුවෝ විශාල ප්‍රමාණයකින් වැඩි වෙලා තියෙනවා. ඒකට හේතුව විදිහට මම දකිනවා ගරු නගරාධිපතිතුමනි, කාණුව ටැංකියක් වෙලා තියෙන්නේ. ඒ ටැංකියේ මදුරුවෝ බෝවෙනවා කියන එක අහන්න දෙයක් නෙමේ. පුංචි දරුවෝ ගොඩක් ඉන්නවා. ඒක විශාල ප්‍රශ්නයක් වෙලා තියෙනවා. ඒ හින්දා ඒ පිළිබඳව ඔබේ අවධානය යොමු කරන්න කියන ඉල්ලීම කරනවා.

<u>නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

සමාවෙන්න මන්ත්‍රීතුමනි, අපි මේ හැමතිස්සෙම මේ සභාවට මාසයකට පාරක් ඇවිල්ලා. හැමතිස්සේම කථා කරන්නේ නගර සභාව කරන්නේ නෑ. නගර සභාව කරන්නේ නෑ කියන එක තමයි. හැමෝගෙන්ම කියවෙන්නේ. හැබැයි, අන්න විල්ලෝරාවත්තේ මම කාණුවක් හදනවා. ඒ කාණුව හදන්නේ බෝදා කුඹුරත් එක්ක සමාන්තරව කාණුවක් හදනවා. දැනට තාප්ප දෙකක් බිමට දැම්මා. ඉඩම් වලින් අල්ල ගත්තා. එතකොට මගෙන් අහනවා ඇයි මෙහෙම. නෑ මේක කරන්න ඕනෑ. හැබැයි එහෙම කරද්දි මම මේක කරනවා. 2018 ඡන්දේ දුන්නෙත් නෑ. මම කිව්වා ඡන්දෙ එපා. එහෙම තමයි ව්‍යාපෘති කරන්නේ. ඔබතුමිය මේ කියන තැන හැම ගෙයක්ම අනවසර ගෙයක්. ලොකුවට තට්ටු දෙකට හදලා තිබුණටට. අවසරයකින් හදපු ගෙවල් නෙමේ. ප්‍රමිතියක් නෑ. කාණුවකට තියන්න ඕන ඉඩ කඩක් තියලා නෑ. හැමතිස්සෙම මෙතැනට ඇවිල්ලා දෝශාරෝපනය කරන්නේම නිලධාරින් ඒක බලන්න කියලා. දෙයියන්ගේ පිහිටෙන් 80% ක් කඩලා දාන්න වෙනවා. අපි කවුරු හරි තමන්ගේ නිවස හදලා මොකක්හරි නගර සභාවට කාණුවකට හෝ ඉඩ තියන්න ඕන තැනකට ඉඩ තියලා කරන්න කියලා කවුරුවත් කියන්නේ නෑ. අපි ඔක්කෝම එතනටයි එන්න ඕන. එතනට ආවට පස්සේ අපි කාටත් ලේසියි වැඩ කර ගන්න. ඒත් එතැනට එන්නේ නෑ. එනැතට එන්නේ නැතිව ඔක්කොම වැරැද්ද කරන්න දීලා ඊට පස්සේ කියනවා. කාණුව බහින්නෑ කියලා හරි දෝශාරෝපණයක් කරනවා. ඔබතුමියට මම දෝශාරෝපනයක් කරනවා නෙමෙයි, නෑ ඒක කරන්න බෑ කියලා ඉවත් කරනවාත් නෙමෙයි, මේක අනිවාර්යයෙන්ම බලන්නම්. ගරු සුරේෂ් මන්ත්‍රීතුමා අපේ බොරුපන මන්ත්‍රීතුමා නිත්‍ය මන්ත්‍රීමා විදිහට එතුමාත් මේ පිළිබඳව අපට දෙපාරක් විතර අපිට දැනුවත් කිරීමක් කරලා තියෙනවා. යෝජනාවේ කවුරු දැනුවත් කළත්, නොකළත් කළයුතු දෙයක්නම් අපි ඒක කරන්නම්. මම මගේ ගැන පම්පෝරි කියා ගන්නවා නෙමේ. මමයි, මගේ තාත්තයි එක ලයිට් කණුවක්වත්, ටෙලිෆෝන් කණුවක්වත් අපේ පාරේ හිටවන්න දෙන්නේ නෑ අපේ පාරට අගතියක් වෙන විදියට. මගේ ගමේ මම ඒ විදියට ගොඩාක් දුරට කටයුතු කරනවා. මෝල් වල ලී පෙරළලා දානවා. විසි කරනවා. ඒවා මම කරනවා. අපි මහජන නියෝජිතයෝ වශයෙන් වගකීම තියෙන්නේ කරන්න දීලා කටයුතු කරන්නේ නැතුව නිකම් ඉදලා කෑ ගහනවාට වඩා, ඔක්කොම අය මැදිහත් වෙනවා නම් මේ වැඩේට මේ විදියට මීට වඩා හරි ලස්සනට කර ගන්න පුළුවන්. මැදිහත්වීම තමයි නැත්තේ.

**03(17)** <u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමාට අපි ආණ්ඩු පක්ෂේ නියෝජනය කරන මන්ත්‍රීවරු වශයෙන් අපිට ලොකු ගැටළුවක් වෙලා තියෙනවා. මේ සැලසුම් අංශයේ ෆයිල් සම්බන්ධව. සැලසුම් අංශයේ සැලසුමක් අනුව තමයි ෆයිල් තියෙන්න ඕනෑ. ෆයිල් හොයනවා හොයනවා හොයා ගන්න විදිහක් නෑ. ෆයිල් එකක් හෝයා ගන්න විදිහක් නෑ. මම ගරු නගරාධිපතිතුමාගෙන් ඉල්ලනවා කර්මාන්ත අංශයේ කට්ටියව ගෙනල්ලා සැලසුම් සහගතව අවුරුද්දේ ෆයිල් හොයා ගන්න පුළුවන් විදිහට කබඩ් ටිකක් හදලා. අවුරුදු 03 ක් ඇතුළත ෆයිල් හොයා ගන්න පුළුවන් ආකාරයට ෆයිල්ස් ටික ගන්න පුළුවන් ආකාරයට සකස් කරන්න. ඔබතුමා ගිහින් බලන්න සැලසුම් අංශයට හැමතැනම ෆයිල්ස් දාලා. මේ මිනිස්සුන්ගේ දේවල්නේ. අපි කවුරුහරි දෙයක් ඉල්ලුවොත් අපිට දෙන්න වෙනවානේ. ඔබතුමාගෙන් මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, කිසිම සැලසුමක් නැති සැලසුම් අංශයක් තියෙන්නේ. ඒක නිසා මේකෙ හරියට සැලසුම් සහගත ලෙස සකස් කර දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**03(18)** <u>මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමාගෙන් කෙටි ඉල්ලීමක් තියෙනවා. මාර්ග පිරිසිදු කිරීම සම්බන්ධයෙන්, මොරටුව උතුර සහ දකුණු ප්‍රදේශවල සමහර පාරවල්වල අඩි දෙක පමණ උසට තණකොළ වැවිලා තියෙනවා. ඔබතුමාගෙන් ඉල්ලීමක් කරලා තියෙනවා නත්තල් සමය හින්දා හැකි ඉක්මනින් මේ පාරවල් ශුද්ධ කරලා දෙන්න කියලා.

**03(19)** <u>මහා නගර සභා මන්ත්‍රී - ජී.එම්. සුරංග එන්. අපෝන්සු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මම පැමිණිල්ලක් ඉදිරිපත් කරනවා. අපි මහජන නියෝජිතයෝ වශයෙන් ඔබතුමා, අපි මොන දේ කථා කළත්, අද තමන්ගේ වගකීම් පැහැර හරින ඇතැම් නිලධාරීන් කොටසක් ඉන්නවා. ඒ වගේම නගරාධිපතිතුමනි, අපි දෛනිකව කසළ බැහැර කිරීමේදී, මාර්ග නඩත්තු කිරීමේදී අපේ නගර සභාවට අයත් වාහනයේ රියදුරා ගේට්ටුවෙන් එළියට ගන්නවා රියදුරා වාහනයේ නෑ. තමන්ගේ ගෝලයෙක් තමයි මේ වාහනය භාවිතා කරන්නේ. ඒ නිසා අනතුරක් සිද්ද වුණොත්, අපි සියලුදෙනාම වගකියන්න ඕනෑ නගර සභාව වශයෙන්. ඒ සම්බන්ධයෙන් කඩිනමින්, හැකිතාක් ඉක්මනින්, අදාළ නිලධාරීන්ව, සුපවයිසර්වරුන්ව දැනුවත් කරන්න. වගකිව යුතු නිලධාරියා වශයෙන් එතුමා වගකියන්න ඕන. රියදුරා වශයෙන් වාහනයෙන් කෙනෙක්ට අනතුරක් වුණොත් රියදුරා වගකියන්න ඕනෑ. නමුත්, රියදුරා මගින් බැහැලා ගෝලයාට වාහනය දීලා යනවා. මේ සම්බන්ධයෙන් හැකි ඉක්මනින් කටයුතු කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

**03(20)** <u>මහා නගර සභා මන්ත්‍රී - රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමාගේ අවධානයට මම යොමු කරන්න කැමතියි. කොවිඩ් ටාස්ක් ෆෝස් එක ටික දවසකට හමු වුණේ නෑ. මම හිතනවා අපි නැවත වරක් හමුවුණානම් හරි උත්සව කාලයක් එන්නේ, ඒ නිසා වර්තමාන තත්ත්වයත්, අනාගතයට අපි ගත යුතු ක්‍රියාමාර්ග කුමක්ද යන්න පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා කොවිඩ් ටාස්ක් ෆෝස් එක නැවත කැඳවන්න කියලා ඉල්ලා සිටිනවා. දෙවන කාරණාව අපට දිනපතා පත්තරය නැවත වරක් ලැබෙන්නේ නෑ. ඔබතුමාගේ අවධානය යොමු කරනවා ඒ කටයුත්ත සම්බන්ධවත්. තුන්වැනි එක උත්සව අත්තිකාරම් සම්බන්ධව මේ මන්ත්‍රීවරුන් කිහිපදෙනෙක් ඔබතුමාගේ අවධානයට යොමු කළා. ඒ සම්බන්ධයෙන් දැන ගන්න පුළුවන්ද, ඔබතුමාගෙන් මේ ගන්නා තීන්දුව. මේක ලබා දෙනවද?, නැද්ද? කියලා පමණක්.

<u>නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, ඒ ඉල්ලීම කරලා තියෙනවා. අප්‍රේල් මාසයේදී උත්සය අත්තිකාරම් ඉල්ලපු වේලාවේදී කොරෝනා නිසා උත්සව අත්තිකාරම් ලබාදීමට නොහැකි වූ තත්ත්වයක් තියනවා. දැනට අපි එදා විශේෂයෙන්ම උත්සව අත්තිකාරම් දෙන්න එපා කියලා චක්‍රලේඛනයක් එවලා තිබුණා. ගෙවල්වල ඉන්න නිසා උත්සව අත්තිකාරම් ඕන නෑ කියලා. මේකට එහෙම දෙයක් කරලා නෑ. හැබැයි දැන් උත්සව අත්තිකාරම් දෙන්න ගියාම සම්පූර්ණයෙන්ම විවිධාකාර වෙනවානේ. නත්තලට කතෝලික අය වැඩිපුර උත්සව අත්තිකාරම් ගන්නවා. අවුරුද්දට බෞද්ධ අය උත්සව අත්තිකාරම් ගන්නවා. දැන් මේක නොගත්ත අයට හේතුවක් තියෙනවා. අපි ගන්නේ අලුත් අවුරුද්දට 2021 ට කියලා උත්සව අත්තිකාරම් සභාවට දරා ගන්න පුළුවන් උත්සව

අත්තිකාරම් ප්‍රමාණයක් වෙයිද කියලා පොඩි සැකයක් තියෙනවා. ඒකත් කළමනාකරණය කරලා ලබාදීමට පුළුවන් උපරිමයට ගිහිල්ලා උත්සව අත්තිකාරම් ලබාදීමට කටයුතු කරනවා.

**03(21)** <u>**මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, කාරණා කිහිපයක් මතු කරන්නයි සූදානම් වෙන්නේ, එකක් තමයි මීට කලිනුත් අපේ ප්‍රභාශනි මන්ත්‍රීතුමිය මතු කරපු කාරණාව. ඒකට බලපාන ප්‍රධාන කාරණා දෙකක් තියෙනවා. එකක් තමයි ගරු නගරාධිපතිතුමනි, මාළිගාව පාර ප්‍රධාන කාණුවේ අග කොටස. එම ප්‍රදේශවාසීන්ම ඉල්ලීමක් කරා, ලියලම දුන්නා. අග කොටස අනවසර ඉදිකිරීමක් තියෙනවා සහ ඒ අග කොටසේ යම් පටුවීමක් තියෙනවා. ගඟට වැටෙන කාණුවේ අග කොටසේ යම් පටුවීමක් නිසා පසුගිය කාලසීමාවේ එම ප්‍රදේශය විතරක් නෙමේ පුංචි වැස්සකටත් එම ප්‍රදේශය යට වෙනවා. ඒ නිසා මගේ යෝජනාව එකක් මාළිගාව පාර අග කොටසේ ඒ කාණුව. ඒවගේම සෙත්සිරි මාවතේ මානෙල් මාවතේ අග කොටස, අග කොටසත්, කිසියම් අවහිර කිරීමක්.

<u>**නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු සුරේෂ් මන්ත්‍රීතුමා, පොඩ්ඩක් ඉන්න. ඉංජිනියර් ලියා ගන්නෙත් නෑ. CPHI ලියා ගන්නෙත් නෑ. මම උඩ ඉඳලා බලාගෙන ඉන්නවා. ඒ කියන්නේ ඕගොල්ලන්ට වැඩක් නෑ. දෙන්නම කවුරුත් ලියා ගන්නේ නෑ. ගොඩක් වෙලා ඉඳලා මේ බල බල ඉන්නේ. දෙන්නා මොකක්ද කරන්නේ කියලා. මට මීටර් තිබුණට ඕගොල්ලන්ට මීටරුත් නෑ. මම ඕක මගෙන් තව අවුරුදු 10 කින් ඇහුවත් සුරේෂ් ඕක මහා සභාවේදී කිව්වා කියලා මට කියන්න පුළුවන්. ඒගොල්ලන්ට එහෙම එකකුත් නෑ. ලියා ගන්නෙත් නෑ. ඕක හරිනම් කරන්න ඕන හෙට දවසෙම මේක බලන්න ඕන. අද සභාව ඉවර වුණාම. දෙයියනේ කියලා මහ වේලාවක් යන්නේ නෑ සභාව ඉවර වෙයි. ඉවර වෙලා දෙන්නත් එක්ක ගිහින් බලන්න ඕනෑ. ඒවා වෙන්න ඕන. මේවා මේ මහජන නියෝජිතයන්ට කරන්න පුළුවන් දේවල් නෙමේ. මට ලොකු කරුමයක් තියෙන්නේ මේ කරත්තේ දක්කගෙන යන කොමසාරිස්තුමා පසුවිපරම් කරන්නේ නෑ. හැමදෙයක්ම වුන් එකට එවෙලෙට විතරයි. පසුවිපරම් නෑ. පසුවිපරම් තියෙනවානම් මේක වෙන්නේ නෑ. සුරේෂ් මන්ත්‍රීතුමා මේක කියන්නේ තුන්වෙනි පාර සභාවේ. හරි නේද මම කියන එක. එක පාරක්වත් ගිහිල්ලා බැලුවේ නෑ. කාණු සෞඛ්‍ය අංශයට භාර එකක් නෙමේ ඉංජිනේරු අංශයේ. එතුමන්ලට තියෙන්නේ පිරිසිදු කිරීම. කාණු තියෙන්නේ සම්පූර්ණයෙන්ම ඉංජිනේරු දෙපාර්තමේන්තුවට. සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට මේ මොරටුවේ තියෙන ඔක්කොම. මේසයක් එහාට මෙහාට කරන්නත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ඕන. මොන දේ කරන්න ගියත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව නැත්නම් මොනවත් කරන්න බෑ. සයිඩ් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙන්. ඒක නිසා ඕක බලන්න අදම.

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, බොහොම ස්තූතියි ඇත්තටම. ඔබගේ මැදිහත්වීම ප්‍රසස්තයි. ඒ ගැන ස්තුතිවන්ත වෙනවා. එකක් තමයි ඒ කාරණය. මානෙල් මාවත කෙළවර අග කොටස සෙත්සිරි මාවතේ එතනින් තමයි බහින්නේ. සාමාන්‍යයෙන් අපි දන්න ක්‍රමය තමයි වතුර බහින ස්ථානය පළල් වෙන්න ඕනෑ වතුර බහින ස්ථානය. නමුත්, මේ වෙන්නේ වතුර බහින ස්ථානය කෙටි වෙනවා. කිසියම් අනවසර ඉදිකිරීම්. ඒ නිසා මම ඔබතුමත් එක්ක බොහොම කෙළින් ඉන්නවා. වැඩි ප්‍රමාණයක පිරිසකට අසාධාරණයක් වෙනවා නම් ජල ගැල්මක් වෙනවානම්, එතන අනවසර ඉදිකිරීම නිසා ඒක වෙනවා නම් මම කොන්දේසි විරහිතව ඒක අයින් කරන්න ඉවත් කරන්න මම

ප්‍රදේශයේ මන්ත්‍රීවරයා විදියට කිසිම ගැටවවක් නෑ. සහය දෙනවා. එකක් ඒ වගේම ගරු නගරාධිපතිතුමනි, මම අයවැය ප්‍රකාශයේදීත් මේක කථා කළා. මම බලාපොරොත්තු වෙනවා බොරුපන ප්‍රදේශයේ අපි පාරවල් හදනවා වගේම. අපි පාරවල් හැදුවට වැඩක් නෑ. අභ්‍යන්තර ජලය බැසීම සඳහා කාණුවක් හැදුවේ නැත්නම්. ඒ නිසා මම බලාපොරොත්තු වෙනවා. ලබන වසර මුල සිට බොරුපන අභ්‍යන්තර ජලය ගලා බසින කාණු පද්ධතිය සැලැස්මත් තියෙන ඒවා මොනවද, වැඩිදියුණු කරන්න ඕන ඒවා මොනවද, සැලසුම් උදව්වක් ඕන ඔබතුමාගෙන්, විශේෂයෙන්ම නාගරික ඉංජිනේරුතුමියගෙන්, ඒ ප්‍රදේශයට ඉන්න තාක්ෂණ නිලධාරිතුමාගෙනුත්, ඒ සම්බන්ධයෙන් මට ඒ අවශ්‍ය කරන උදව්ව ලබා දෙන්න කියලා. ඒ වගේම අවසන් කරුණ නගරාධිපතිතුමනි, ඒක මම යෝජනාවක් විදිහට තමයි ගේන්න බලාපොරොත්තු වුණේ. නමුත්, ගරු නගරාධිපතිතුමනි, පෙරේදා දිනයේ අපේ මොරටුවේ ගායක ශිල්පියෙක් වන ඇන්ටන් සිල්වා මහතා හමුවෙලා, ඔහු කරපු ඉල්ලීම අනුව, මට ලැබුණා CD පටයක්. ඇන්ටන් සිල්වා මහතාගේ ඉල්ලීම අනුව තමයි මම මේ ප්‍රකාශය කරන්නේ, අපි කවුරුත් දන්නවා නගරාධිපතිතුමනි, මේ කොවිඩ් - 19 වෛරසය හේතුකොටගෙන විශේෂයෙන්ම අපේ රටේ නෙමේ, මුළු ලෝකයම සෑම ක්ෂේත්‍රයකටම බලපෑවා වගේ විශේෂයෙන්ම අපේ රටේ කාගෙත් අවධානයට ලක්වෙච්ච අඩු පිරිසක් තමයි මේ එළිමහන් කලාවේ නිරත වෙන පිරිස. විශේෂයෙන්ම සංගීත කණ්ඩායමේ ඉඳලා, ගායන ශිල්පීන්ගේ ඉඳලා, සරුවත් විකුණන, කඩල ඇටේ විකුණන කෙනාගේ ඉඳලා, අද මාස 8 කට වඩා වැඩි කාලයක් ඔවුන්ගේ ජීවිකාව අහිමි වෙලා තියෙනවා. ඉතිං ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, මම මේක යෝජනාවක් විදියට දාන්න හිටියේ. අපි කර්මාන්ත අමාත්‍යාංශයේ විදියට ගරු ඇමතිතුමත් එක්ක සම්බන්ධ වෙලා සාකච්ඡා කරලා මේකට වැඩි පිළිවෙලක් අපි හදලා තිබුණා. නමුත්, මේ කොරෝනා දෙවෙනි රැල්ල හේතුකොටගෙන ඒක ආයි පස්සට ගියා. නමුත්, ලබන අවුරුද්දේ අපි ඒක කරන්න බලාපොරොත්තු වෙනවා. කර්මාන්ත ප්‍රදර්ශන හරහා ස්වයං රැකියාවල නිරතවෙලා ඉන්න පිරිසට ඔවුන්ගේ නිෂ්පාදන පාරිභෝගිකයන්ට අතරමැදියන්ගෙන් තොරව අලෙවි කිරීම සඳහා අවස්ථාව ලබා දෙන ක්‍රමවේදයක්. මේ වැඩේටත් අපි යම් උත්තරයත් හොයන්න ලෑස්ති වුණා. මම ඉල්ලා සිටින්නේ ගරු නගරාධිපතිතුමනි, විශේෂයෙන්ම අපි සභාවක් විදියට මොරටුවේ, ඇන්ටන් සිල්වා මහත්තයා වගේම අසරණ වෙච්ච මම දන්නවා පුද්ගලිකව ඔබතුමා එතුමට සුවිශේෂී දායකත්වයක්, උදව්වක් කරලා තියෙනවා. ඒක ප්‍රසිද්ධ නොකරපු දෙයක්. නමුත්, ඔබතුමා වෙනුවෙන් ඒක මතක් කරන්න ඕන. මම ඒක හොඳටම දන්නවා. ඒ වගේම මොරටුවේ ඉන්න මේ වගේ විශේෂයෙන්ම එළිමහන් ප්‍රසංග වලින් පමණක්ම ජීවත් වන පිරිසක් ඉන්නවා. ඒ අය සම්බන්ධයෙන් යම් මැදිහත්වීමක් කරන්න කියලා ඉල්ලමින්, ඇන්ටන් සිල්වා මැතිතුමා මගෙන් ඉල්ලීමක් කළා ගරු නගරාධිපතිතුමනි, ගායක ශිල්පියෙක් සින්දුවක් කිව්වොත් තමයි සල්ලි හම්බ වෙන්නේ, දැන් මුකුත් එහෙම කරන්න බෑ. ප්‍රසංග සම්පූර්ණයෙන්ම තහනම්. ඒකත් කවුරුත් දන්නවා. CD පටි කිහිපයක් මුද්‍රණය කරලා තියෙනවා. එතුමා ඉල්ලීමක් කළා. මමම ඒ ඉල්ලීම එතුමා වෙනුවෙන් මේ සභාවේදී කරනවා. ඒක එතුමට කරන අගෞරවයක් නෙමේ. මම මේ ඉල්ලීම එතුමා වෙනුවෙන් කරනවා. අපිට පුළුවන් මට්ටමින් මේ CD පටි එක්ක රුපියල් 100/- යි. අපිට පුළුවන් මට්ටමින් මේ CD පටි මිලදී අරගෙන හරි එතුමට යම්කිසි දායකත්වයක් සුවිශේෂී ගායන ශිල්පියෙක්. ඉතිං ඒ නිසා එතුමට ඒ මැදිහත්වීම කරන්න කියලා අපේ සියලු මන්ත්‍රීතුමන්ලාගෙන්, සියලු දෙනාගෙන් ඉල්ලා සිටිනවා එතුමා වෙනුවෙන්.

**03(22)** <u>මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, විශේෂ කාරණයක් මට අතපසු වෙච්ච මතු කරන්න තියෙනවා. සභාව පැත්තෙන් වැදගත් නිසා මම ඒක මතු කරනවා. ඒ තමයි නගරාධිපතිතුමනි, මේ දවස්වල අපේ

සංවර්ධන කටයුතු යනවා. ඒ දවස් වලත් ගියා. අපි හිතමු කාණුවක් හදනවා කියලා. ඒ කාණුව හදනකොට, ඒ හදන්න ඕන සිමෙන්ති ටික අනන්නේ කාපට් පාරේ. හැබැයි අන්තිම වෙනකොට අමතක වෙනවා අපේ කොන්ත්‍රාත්කරුට ඒක ටිකක් ශුද්ධ කරලා දාන්න. මේ නිසා ගරු නගරාධිපතිතුමනි, අනර්ඝත්වයේ වැඩ නිමාව කියන එකටත්, අපිට බලපානවා වගේම , කොලිටි වර්ක් එකටත් බලපානවා. මේක හැම තැනම තියෙනවා. සමහරක් වෙලාවට කොන්ත්‍රාත්කරුවාගේ පැත්තෙනුත් මේක වෙනවා. අපේ ජනතාව පැත්තෙනුත් වෙනවා. අපි මෝදර කාපට් ලයින් එක දැම්මට පස්සේ පහුවෙනිදාට තමයි මිනිස්සුන්ට වතුර ගන්න මතක් වෙන්නේ. එතකොට එකේ තමයි සිමෙන්ති ටික අනන්නෙත්. වතුර ටිකක්වත් ගහන්නේ නෑ. එතකොට නගරාධිපතිතුමනි, මම විශ්වාස කරනවා අපිට කොලිටි වර්ක් ගයිඩ් ලයින් එක්ක පොඩි මාර්ගෝපදේශයක් හදා ගන්න පුළුවන් උනොත් වැඩ කරන කට්ටියට මේ කොලිටි ටික වැඩේ නිමාවෙනවාත් එක්ක කරන්න ඕන කියලා. මේ ව්‍යාපෘතිවල ගුණාත්මක භාවය තව වසර ගණනාවකට අපිට ගෙනියන්න පුළුවන් වෙයි.

**03(23)** <u>මහා නගර සභා මන්ත්‍රී - පී.එච්. මහේෂ් රුක්මාල් ඩයස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අඟුලාන කොට්ඨාසයේ ගියමස දවස් දහයක පමණ කාලයක් ඇඳිරි නීති තත්වේත්, ඊට පසුව, දවස් එකොළහක පමණ හුදකලා තත්වේ ඇතිවෙච්ච අවස්ථාවේදීත් ඔබතුමා මැදිහත් වෙලා, ඒ කොරෝනා කමිටුව කැඳවලා, ඒ අඟුලානේ තිබ්බ විශාල ප්‍රශ්නය ඔබතුමා හඳුනා ගත්තා. ඒ ප්‍රශ්නය නම් ලෙඩ්ඩුන්ට එළියට යාමට හැකියාවක් තිබුණේ නෑ. අමාරුම ලෙඩ්ඩුන්ට පමණයි ඒ පොලිස් වසමේ යන්නට තිබුණේ. ඔබතුමා මැදිහත් වෙලා වෛද්‍යවරයෙක් සමඟ ජංගම රථ සේවාවක් ලබාදීලා විශාල ජනතාවකට ඒ පහසුකම ලබා දුන්නා. ඒ වගේම සයුරුපුර මහල් නිවාසයේ පීඩන තත්ත්වයෙන් හිටපු ඒ අසරණ ජනතාවගේ මානසික පීඩනයෙන් මිදීමට ඔබතුමා අනුග්‍රාහය දක්වලා සංගීත සංදර්ශනයක් පැවැත්වූවා. ඒ සංගීත සංදර්ශනය පැවැත් වූ අවස්ථාවේදී අපි දැක්කා ඒ ජනතාව සැහෙන්න සතුටු වුණා. මොකද ඒ ජනතාව විශේෂ පීඩනයකින් ඒ අවස්ථාවේදී සිටියේ. ඒ වගේම ඔබතුමා මට කතා කළා. කථා කරලා වියළි සලාක බෙදන්න පුළුවන් කියලා මට කිව්වා. ඊට පසුව ඒක බෙදන්න තිබුණු දවසට කළින් දවසේ ඒ කටයුත්ත කර ගැනීමට අවස්ථාව ලැබුණේ නෑ.

<u>නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

හුදකලාව අවසන් වූ නිසා.

<u>මහා නගර සභා මන්ත්‍රී - පී.එච්. මහේෂ් රුක්මාල් ඩයස් මහතා</u>

හුදකලාව අවසන් වූ නිසා. ඔබතුමාටත්, අපිටත්, ඒ කටයුත්ත කර ගන්න අවස්ථාව ලැබුණේ නෑ. ඒ කටයුත්ත කිරීමට ඊට පසුවදා සූදානමින් සිටියා. ඒ වගේම අපේ PHI මහත්වරුන්, කොමසාරිස්තුමා, ලේකම්තුමා ඇතුළු නිලධාරි මහත්වරුන් විශාල කාර්ය භාරයක් කළා අඟුලාන ජනතාව වෙනුවෙන්. ඔබතුමා ඇතුළු කාර්ය මණ්ඩලයට මම මේ අවස්ථාවේදී කොට්ඨාසයේ මන්ත්‍රීවරයා හැටියට මාගේ ස්තූතිය පුද කරනවා.

**03(24)** <u>මහා නගර සභා මන්ත්‍රී - එස්. බේසර රවින්ද්‍ර පුනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, පුරෝගාමී නගරයට හැමදාම ආභරණයක් වැනි කලාකරුවන්ගේ දායකත්වය ලැබෙනවා . දශක 50 ක් පමණ ගායනයෙන් අපේ රටට සේවයක් කරා වූ අවුරුදු 68 ක් ආයු වළඳා මාගේ කොට්ඨාසයේ පදිංචිව සිටි පොල් ප්‍රනාන්දු මහතා පසුගිය 16 වෙනිදා අපි අතරින් වියෝ වූවා. විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ . ගරු නගරාධිපතිතුමනි, රටේ සෞඛ්‍ය

ගැටළු තියෙන යුගයක බොහෝ දෙනෙකුට ඒ අවස්ථාවට සහභාගිවීමට නොහැකි වුණත්, සියලු මොරටුව ජනතාව නියෝජනය කරමින් ඔබතුමාගේ සහභාගිත්වය ප්‍රදේශයේ මන්ත්‍රීවරයා විදියට මා විසින් අගය කරනු ලබනවා. ඒ වගේම දෙවනි කාරණය ගරු නගරාධිපතිතුමනි, මේ දවස්වල කොවිඩ් ප්‍රශ්නය හින්දා පාසල් පැවැත්වෙන්නේ නෑ දරුවන්ගේ. අධ්‍යාපන බලධාරින් විසින් ඒ අඩුව මකා දමමින්, ඔන් ලයින් පවත්වනවා. මේ ඔන් ලයින් පන්ති වලට මුවාවෙමින්, ගරු නගරාධිපතිතුමනි, යටින් කුමන්ත්‍රණශිලි ව්‍යාපාරයක් යනවා ෆ්‍රී ෆයර් ගේම්ස් කියලා. ෆ්‍රී ෆයර් ගේම්ස් සෙල්ලමක්. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, වැඩිහිටියන් හැටියට අපි දරුවන්ගේ අවධානය හා දරුවන්ගේ දෙමව්පියන්ගේ අවධානය යොමු කළ යුතුයි මොකද මේ අධ්‍යාපනය කරන මුවාවෙන් මේ ෆයර් ෆ්‍රී ගේම් නිසා දරුවන්ගේ මනස සම්පූර්ණයෙන්ම විකෘති වෙලා තියෙන්නේ. දරුවන්ට කේන්ති යාම, වේලාවට කන්නේ බොන්නේ නෑ, අධ්‍යාපනය නිසි අයුරින් කරන්නේ නෑ. මේක මාධ්‍යයටත් ලොකු වගකීමක් තියෙනවා. මේක ගැන දැනුවත් කරලා අපේ අනාගත පරපුර නිසි ආකාරයෙන් මේ දේවල් වලින් වළක්වාගෙන ඔවුන්ව සුමගට ගැනීම. මුළු ලෝකය පුරාම මේ වෙනකොට දැඩි භීතියකට පත්වෙලා තියෙනවා. කොරෝනා වසංගතය නොයෙකුත් ප්‍රතිකාර, නොයෙකුත් දේවල් අත්හදා බැලීම් කරන වකවානුවක අපගේ දේශීය හෙළ පරම්පරාවේ වෙද මහතෙකු විසින් කොවිඩ් පැණියක් සාර්ථක ලෙස 100% ක්ම කොවිඩ් ප්‍රතිකාර පැණියක් නිපදවලා තියෙනවා. ලාංකික පුරවැසියන් හැටියට විශේෂයෙන්ම මොරටුව ජනතාව හැටියට එතුමාගේ ඒ කොවිඩ් පැණිය සාර්ථකත්වයට පත් වේවායයි කියා ප්‍රාර්ථනා කරනවා.

**03(25)** <u>මහා නගර සභා මන්ත්‍රී - පී. අශෝක ඉන්ද්‍රතිලක ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ආදර්ශ නගරයේ දෙවන පටුමග. ඒ මාර්ගය අපි විශාල මුදලක් වියදම් කරලා සකස් කළා. සකස් කරපු මාර්ගය කිසියම් පිරිසක් විසින් පළුදු කරලා තියෙනවා. ටෙලිකොම් නළකෙන් හරි, වෝටර් බෝඩ් එකෙන් හරි. ඔබතුමා නිලධාරියෙක් යවලා බැලුවොත් එහෙම, මේ ගල් ගලවලා තියෙනවා කිසිම ක්‍රමවත් වැඩපිළිවෙලක් නැතිව. ආදර්ශ නගර දෙවන පටුමගේ මැද. ඒක ඉතිං ඔබතුමා මම හිතන්නේ.

<u>නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

දැන් මමද ඒක කරන්න ඕන මන්ත්‍රීතුමා.

<u>මහා නගර සභා මන්ත්‍රී - පී. අශෝක ඉන්ද්‍රතිලක ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, නිලධාරින් කවුරුත් බලන්නේ නැනේ ඒක.

<u>නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ඔබතුමා ඔක ලියලා ඉංජිනේරු දෙපාර්තමේන්තුවට යොමු කරන්න.

<u>මහා නගර සභා මන්ත්‍රී - පී. අශෝක ඉන්ද්‍රතිලක ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඒ වගේ ලියුම් වලින් මාර්ග කිහිපයක්ම ඔබතුමා අත්සන් කරලා දිලා තියෙනවා. ඒවා ක්‍රියාත්මක වෙලා නෑ තාම. ඒක නිසා අවධානය යොමු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. මොකද පාර කැඩිලා ගියොත් අපරාධයක්නේ ඒක.

**03(26)** <u>මහා නගර සභා මන්ත්‍රී - යූ. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, කල්දෙමුල්ල ආතර් පෙදෙසේ අතුරු මාර්ගයක් තියෙනවා . එකේ මාස තුන හතරකට කළින් මම මේ සභාවේ ඒ නිවැසියන් ලිඛිතව අත්සන් කරලා ලබාදීලා තිබුණා. මම ඒක සභාව සතු කළා නගරාධිපතිතුමනි, අද වෙනකම් ඒ අතුරු මාර්ගය කැඩී බිඳී තියෙනවා. අවුරුද්දකට වැඩියි. දැන් මේ මාස තුකත් එක්ක ගත්තොත් අවුරුද්දයි මාස තුනක් විතර වෙනවා. ඒක නිසා ඒ නිවැසියන් මගෙන් නිතරම ඉල්ලා සිටිනවා. ඒ කැඩිලා තියෙන ඒ පාර ප්‍රිමික්ස් වලින් සම්පූර්ණයෙන්ම කරන්න හදන්න බැරිනම්. ඒ කැඩිලා තියෙන වලවල් ටික හරි ඉක්මනින් ප්‍රතිසංස්කරණය කරන්න කියලා. ඊට අමතරව ගරු නගරාධිපතිතුමනි, මේ ගිය සතියේ කල්දෙමුල්ල පටුමගේ අතුරු මාර්ගයක් තියෙනවා. ඒක මේ ළඟදී නගර සභාවෙන් ශුද්ධ කළා. පස් ඒ ටික ගොඩ දාලා .

<u>නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

පස් ඒ ටික ගත්තා මන්ත්‍රීතුමා.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>

ඔක සතියක් විතර තිබුණම අපිටත් හොද නෑ. සභාවටත් හොද නෑ. ඕක අද ඊයේ වෙච්ච දෙයක් නෙමේ හැමදාම වෙන කථාවක්.

<u>නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

මන්ත්‍රීතුමා, එතුමා කියන කාරණය හරි. අපිට විසඳුමක් අද දිනයෙදී ලැබුණා. ඒ වත්තට අපිට අවශ්‍ය විදියට අපි මාසෙකට ලක්ෂෙටකට වැඩිය පස් ගෙනියලා දාන්න තැනක් නැති වුණාම වත්තට ගෙනියලා මාසෙට ලක්ෂ එකහමාරක් දෙකක් විතර අපි සල්ලි ගෙවනවා. දැඩි ගැටළුකාරි යුගයක් තිබුණා. දෙයියනේ කියලා කසුන් මහත්මයාට පිංසිද්ද වෙන්න අපිට හම්බවෙලා තියෙනවා වත්තක් අක්කර 05 ක අපිට පුළුවන් වෙනවා ගිහිල්ලා දාන්න. අපිට දාන්න තැනක් නැති නිසයි ඔය වගේ පොඩි පොඩි අපහසුකම් ඇති වුණේ. දැන් ඒක නිසා ඒ කාර්යය කරන්න පුළුවන්.

**03(27)** <u>මහා නගර සභා මන්ත්‍රී - යූ. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>

ඒ වගේම තව කරුණක් තියෙනවා ගරු නගරාධිපතිතුමනි, දැන් මේ කොවිඩ් ප්‍රශ්නය. දැන් මේ කොවිඩ් - 19 ප්‍රශ්නය මේ රටේ කොවිඩ් රෝගීන් සිය දහස් ගණනින් වැඩි වෙනවා. මොරටුවෙත් අපේ අවධානමක් තිබුණා. බ්‍රැන්ඩෙක්ස් පොකුරෙන් ආපු දෙවන කොවිඩ් - 19 වසංගතය මොරටුවේ අපේ දෙසිය ගාණක් රෝගීන් සිටියා. නමුත්, රෝගීන් පහ වෙලා ගියත්, කොළඹ දිස්ත්‍රික්කයේ එන්න එන්නම රෝගීන් වැඩි වෙනවා. ගරු නගරාධිපතිතුමනි, අපි කියන්නේ, මේ අවුරුද්දේ, 2020 අවසානය අපි දකින්නේ. 2021 තව මාස දොළහක් ඉදිරියට තියෙනවා. 2021 අවධානමක් තියෙනවා කියලා අපේ විශේෂඥ වෛද්‍යවරු සහ සෞඛ්‍ය ආයතන වලින් අපට ප්‍රකාශ කරනවා. ගරු නගරාධිපතිතුමනි, අපි කියන්නේ මොරටුව තුළ අපි සභාවක් විදියට මේකේ වගකීම අතට අතරටගෙන කොවිඩ් අපි රැන්ඩම් ඒ කියන්නේ තැන් තැන් වලින් 2021 ටත් මොරටුව ආසනයේ සීමා කරන්න. කොවිඩ් රෝගීන්. අපි තේමාවක් කර ගමු, ප්‍රාර්ථනාවක් කර ගමු. කොවිඩ් - 19 රෝගය 2021 වර්සයේදී තුරන් කර ගැනීමට ප්‍රාර්ථනා කර ගමු. අපි ක්‍රියාත්මක කළොත් 2021 දී අපිට සාර්ථක ප්‍රතිඵල නෙලා ගන්න පුළුවන්. ගරු

නගරාධිපතිතුමනි, අවසාන වශයෙන් කියන්න ඕන අපි විපක්ෂේ මන්ත්‍රීවරුන් විදියට වසර ගණනාවක් එනවා. එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින්, ඒ වුණාට අපිට සභාවෙන් වෙන්න ඕන දේවල් අපි ඔබතුමාලට නිතරම කියලා කියලා තමයි නිලධාරින් එක්ක සම්බන්ධ වෙලා තමයි අපි මොනවාහරි වුණත්, අවම වශයෙන් වුණත් අපි කර ගන්නේ. 2021 වර්ෂටයදී පළාත් පාලන මැතිවරණය ගන්නේ, කොට්ඨාස ක්‍රමයට තමයි මේ පාර ආවේ.

<u>**නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

කියන්න බෑ ඊළග එක කොහොමද කියලා.

<u>**මහා නගර සභා මන්ත්‍රී - යූ. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා**</u>

කොට්ඨාස මට්ටමින් තමයි මන්ත්‍රීවරයා පත් කර ගන්නේ. කොට්ඨාස මන්ත්‍රීවරයා පත් කර ගන්නකොට ඒ මන්ත්‍රීවරයා පක්ෂ පාට නොබලා මේ සභාවට පත් වෙනවා. එතකොට මේ වසර තුළ නගර සභාවෙන් අපිට වෙන්නා වූ දේවල් නිසියාකාරව වුණේ නෑ නගරාධිපතිතුමනි, 2021 වර්ෂයට මේ විපක්ෂේ මන්ත්‍රීවරු ඉන්නවා බහුතරයක්. 2021 වර්ෂයේදීවත් විපක්ෂයේද කියලා බලන්නේ නැතිව අදාළ කොට්ඨාස වලට ඒ සංවර්ධන කටයුතු ලබා දෙන්න කියන යෝජනාව විපක්ෂේ මන්ත්‍රීවරයෙක් විදියට මම මේ අවස්ථාවේදී කරනවා.

<u>**නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

අපි කරානේ ඉතිං. ඇයි ඔයා දැන් කරන්නේ.

<u>**මහා නගර සභා මන්ත්‍රී - යූ. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා**</u>

ඉතිං ඒක නිසා ගරු නගරාධිපතිතුමනි, ඒක වෙන්න කියලා මම ප්‍රාර්ථනා කරනවා. ඒ වගේම ලබන්නා වූ නත්තල අපේ මොරටුවේ කතෝලිකයන්ගේ උත්සවයක්.

<u>**නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

මොරටුවේ නෙමේ ලෝකයේම.

<u>**මහා නගර සභා මන්ත්‍රී - යූ. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා**</u>

ලෝකයේ සහ මොරටුවේ. නත්තල සමරන්න සියලු දෙනාටත්. 2021 වර්ෂය කොවිඩ් වසංගතය හා අනෙකුත් වසංගත, ඩෙංගු රෝගය නැති වේවා. ඒ වගේම මොරටුවේ සංවර්ධනය දියුණු වේවා කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

<u>**නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, මීළඟට තියෙන්නේ, යෝජනා. සුදේශ් මන්ත්‍රීතුමා ඔබතුමාගේ 13 (ඵ) වගන්තිය යටතේ යොමු කරන්න තිබුණ යෝජනාව ඊළඟ සබාවට ඉදිරිපත් කරන්න.

## 04. <u>ප්‍රශ්න</u> - නැත

## 05. <u>යෝජනා</u> -

<u>**නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

මීළඟට යෝජනාවක් තියෙනවා අතුරු ව්‍යවස්ථාවේ 13 (ඌ) වගන්තිය යටතේ මන්ත්‍රීවරුන් පිරිසක් විසින් සභාවට යොමු කළ යෝජනාවක් ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙනවා. යොමු කිරීම සඳහා. මා විසින් ඒ යෝජනාව ඉදිරිපත් කරනවා.

**05(01)** නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු, මහා නගර සභා මන්ත්‍රී, එල්. ඔසඳ හර්ෂණ අබේකෝන්, කේ.ඩී. අනුර ප්‍රනාන්දු, යූ. ලලිත් ප්‍රනාන්දු, එෆ්. බී. නිලංක සිල්වා, එම්. ජයමාල් ශ්‍රියාරත්න, ඩබ්ලිව්. ප්‍රිනිත් ක්‍රිශාන්ත විජේරත්න යන මහතුන් විසින් 13(ඌ) වගන්තිය යටතේ ඉදිරිපත් කළ යෝජනාව **නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා විසින් සභාවට ඉදිරිපත් කරන ලදි.**

"මොරටුව මහා නගර සභා බල ප්‍රදේශය තුළ එක්රැස් වන කැළි කසළ අවසන් බැහැරලීම සිදු කිරීම කරනු ලබන බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය මගින් පාලනය වන කරදියාන කසළ අංගනයට කසළ බැහැර කිරීම වෙනුවෙන් 2016.08.01 දිනැතිව එම අධිකාරිය සමග ඇති කරගත් ගිවිසුම් කොන්දේසි වලට පටහැනිව ක්‍රියා කරමින් එම ගිවිසුම බලාත්මකව නොතිබුණු 2016.03.01 දින සිට අතීතයට බලපාන පරිදි නීතියට පටහැනිව ගිවිසුමේ සඳහන් ගාස්තු ප්‍රමාණය අනුව, බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියට මුදල් ගෙවීමෙන් මහා නගර සභා ආඥා පනත උල්ලංඝනය කරමින් ද, මොරටුව මහා නගර සභාවට පොදු පුරවැසියන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය කරමින් ද හා මොරටුව මහා නගර සභාවට සිදු කළ මූල්‍යමය පාඩුව සම්බන්ධව එවකට මොරටුව මහා නගර සභාවේ නාගරික කොමසාරිස් එම්.එම්.සී.කේ.කේ. මාන්නප්පෙරුම මහතා විසින් කටයුතු කළ ආකාරය සම්බන්ධයෙන් වහාම පරීක්ෂණයක් පවත්වා ඒ සම්බන්ධව ඔහුට එරෙහිව නීතයානුකූලව කටයුතු කළයුතු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි. "

අංක 05(01) දරණ යෝජනාව මහා නගර සභා මන්ත්‍රී එච්. ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා ස්ථිර කළේය.

ඉහත 05(01) දරණ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>**නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

එහෙමනම් මම මේ ගැන කථා කරන්නේ නෑ. අදාළ වන්නා වූ කාරණය සම්බන්ධව කාට හරි කථා කරන්න තිබේනම් කථා කරන්න පුළුවන්. නැතිනම් අදාළ වන්නා වූ කමිටුව මගින් මේකට අවශ්‍ය කටයුතු කරන්න පුළුවන්.

## 06 2020 නොවැම්බර් මස කමිටු වාර්තා සලකා බැලීම.

### 06(01) 2020.11.13 දින පැවැති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු කමිටු වාර්තාවේ නිර්දේශයන් සලකා බැලීම.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. සේනක දමයන්ත සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මුදල් කමිටුව වෙනුවෙන් අපේ ස්ථාවරය. අංක 03 සිට අංක 09 දක්වා අපි නිහඬයි. ඒ එක්කම අංක 10 ට අපි විරුද්ධතාවය ප්‍රකාශ කරනවා. ඒ වගේම අංක 11 ට අපේ විරුද්ධතාවය ප්‍රකාශ කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මුදල් කමිටුව පිළිබඳව යම් අදහසක් කිව යුතුව තිබෙනවා. ඒක පොදු අදහසක් ලෙස ඉදිරිපත් කිරීම හොඳයි කියලා හිතෙනවා. මිලියන හැටකට, හැටපහකට එහාපැත්තෙ ඇස්තමේන්තු තිබෙනවා. එම ඇස්තමේන්තු මුදල් කමිටුවට ඉදිරිපත් කරනවා. ගරු නගරාධිපතිතුමනි, මම සභාවේ දිගින් දිගටම කිව්වා. කොමසාරිස්තුමා සමහරක් අවස්ථාවල එකඟ වුණා. ලිඛිතවත් දුන්නා කියලා කිවුවා. යම් සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාවට නැගීමේදී අනුගමනය කළයුතු මූලික ක්‍රියාවලිය. ඇස්තමේන්තු අනුමත කිරීම, කොන්ත්‍රාත් ප්‍රදානය, මුදල් ගෙවීම. ඇස්තමේන්තු මේ සභාවට එනවා අනුමත කරනවා. අපට අවස්ථාවක් දෙනවා ඒවායෙහි අඩුපාඩු තියනවානම් නිවැරදි කරන්න. ඊළඟට ටෙන්ඩර් ක්‍රියාවලියට යනවා. ටෙන්ඩර් ක්‍රියාවලිය නැවත සභාවට එනවා. අපට දෙනවා අවස්ථාවක් නැවත එහි තිබෙන අඩුපාඩු නිවැරදි කරන්න. ව්‍යාපෘතිය එනවා. නැවත මුදල් ගෙවනවා. මුදල් ටික ගෙවනවා. රඳවුමක් තියාගන්නවා. මෙම ලේඛනයේ තියන කොන්ත්‍රාත් මුදල් ගෙවලා ඉවරයි. සියලු මුදල් සහා අරමුදල්. මුදල් ගෙවලා ඉවරවෙලා ඇයි අපට කියන්නේ අනුමත කරන්න කියලා. 3 වන පටුමගට කොන්ත්‍රාත් ප්‍රදානය කරනවා. 5 වන පටුමහට ගෙවනවා. මෙය විශාල වැරැද්දක්.

\- සභා ගෝෂා -

ජනසෙත පරිගණක පුහුණු පාඨමාලාව උගන්වන සර්ට ගෙවන ගෙවීම මාස ගානක් ගෙවලා නැහැ. ගෙවන්නේ නැත්තේ ඇයි?

<u>නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමනි, මෙය වරදක්. මුදල් කමිටුවට යොමුකරන්නේ නැතුව මෙය ගෙවන්න බැහැ. පනතේ තියනවා. නිලධාරීන් දිගින් දිගටම කියනවා. මෙය ගෙවන්න බෑ කියලා. සභා ආවරණ අනුමැතිය යටතේ අපි එම ගෙවීම කරමු.

<u>මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, කොරෝනා තත්ත්වය නිසා මාසික ආදායම් හා වියදම් වාර්තා දෙන්න බෑ කියනවා. ඒකට අපිට එකඟ වෙන්න බෑ. මීට මාස කිහිපයකට පෙර ලැබිය යුතු විගණන වාර්තාව අපට ලැබුනේ නැහැ. අපිට ඒක දෙන්නේ නැත්තේ ඇයි?

<u>නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, ඔය වාර්තා එවන්නේ මම නෙවෙයි. මම කියන්නම් නිලධාරීන්ට ඒක දෙන්න කියලා.

<u>මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අපි මොරටුවේ ජනතාවට කියනවා. ඔබේ බදු මුදල් වැයවන ආකාරය පිළිබඳව අපට බරපතල විවේචනයක් තියනවා. නමුත්, අපි අකමැත්තෙන් වුණත් පිළිගන්න පුළුවන් ඔබේ පාලනයක්, මහජනයාගේ පාලනයක්, ඒක නිසා මහජන නියෝජිතයින්ට කියනවා ඔබ අත් ඉස්සුවට කමක් නෑ. පසුව හරි ගිහිල්ලා මේවා හොඳින් බලලා ඔබේ ආණ්ඩු පක්ෂයේ ඇතුළේ හරි මේවට අරගලයක් කරලා මේවා නිවැරදි කරන්න.

- සභා ඝෝෂා -

**2020.11.13 දින පැවැති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

| | | | |
|---|---|---|---|
| 01. | නගරාධිපති | - | ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා |
| 02. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩී. සමන්ත සිල්වා මහතා |
| 03. | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්. සුරංග නිශාන්ත අපෝන්සු මහතා |
| 04. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා |
| 05. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 06. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්. ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා |
| 07. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්. ඔසඳ හර්ෂන අබේකෝන් මහතා |
| 08. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා |
| 09. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.ඩබ්ලිව්. රන්දු නිරෝෂන මහතා |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. නාලනී ප්‍රේමවතී ප්‍රනාන්දු මහත්මිය |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | පී. අශෝක ඉන්ද්‍රතිලක ප්‍රනාන්දු මහතා |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.එම්. මහේෂ් රුක්මාල් ඩයස් මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | පී. යසන්ත රන්සිරි ප්‍රනාන්දු මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.ඩබ්ලිව්.එම්. නිෂා ඉරානි විජේවික්‍රම මහත්මිය |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩී. අනුර ප්‍රනාන්දු මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. ලලිත් ප්‍රනාන්දු මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්. කේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | එෆ්.බී. නිලංක සිල්වා මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.කේ.පී. සුසන්ත පෙරේරා මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්ලිව්. ප්‍රිනිත් ක්‍රිෂාන්ත විජේරත්න මහතා |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. කුමාර රාජරත්න මහතා |
| 23. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. පිලිප් ෆැන්සිස් ප්‍රනාන්දු මහතා |
| 24. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. ජයමාල් ශ්‍රියාරත්න මහතා |

25. මහා නගර සභා මන්ත්‍රී - එම්.බී. මල්ලිකා ජයවතී ප්‍රනාන්දු මහත්මිය
26. මහා නගර සභා මන්ත්‍රී - එච්. උජිත් ක්‍රිෂාන්ත කල්දේරා මහතා
27. මහා නගර සභා මන්ත්‍රී - ඒ. දීපා චාන්දනී ආරියවංශ මහත්මිය

**2020.11.13 දින පැවැති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 10 සහ අංක 11 ට විරුද්ධවත්, අංක 03 සිට අංක 09 දක්වා කමිටු නිර්දේශයන්ට පක්ෂව හා විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටි අතර, අනෙකුත් සියලු කමිටු නිර්දේශයන්ට පක්ෂව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

01. මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා
02. මහා නගර සභා මන්ත්‍රී - එම්. සුනිල් නන්දසිරි මහතා
03. මහා නගර සභා මන්ත්‍රී - රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා
04. මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා
05. මහා නගර සභා මන්ත්‍රී - එම්. තිසර රසාංජන මැන්දිස් මහතා
06. මහා නගර සභා මන්ත්‍රී - යූ. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා
07. මහා නගර සභා මන්ත්‍රී - ආර්.එම්.ඒ. දෝන දිලාශිනී මහත්මිය
08. මහා නගර සභා මන්ත්‍රී - යූ. ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා
09. මහා නගර සභා මන්ත්‍රී - ජී.එම්. නිරෝෂන් රුවමාල් අපෝන්සු මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - එම්. සුදර්ශනී ප්‍රියන්තිකා කුරේ මහත්මිය
11. මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
12. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
13. මහා නගර සභා මන්ත්‍රී - එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
14. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්ලිව්. ශ්‍රියානි හේමලතා ප්‍රනාන්දු මහත්මිය
15. මහා නගර සභා මන්ත්‍රී - ආර්. ක්‍රිෂනි ප්‍රනාන්දු මහත්මිය

**2020.11.13 දින පැවැති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට විරුද්ධව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

01. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා
02. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්ලිව්.පී. ප්‍රභාෂනී වික්‍රමසිංහ මහත්මිය
03. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා
04. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්ලිව්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා

**2020.11.13 දින පැවැති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

**(මේ අවස්ථාවේ මහා නගර සභා මන්ත්‍රී ඩබ්ලිව්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා සභා ගැබෙහි නොසිටියහ.)**

**07.** **පුද්ගලික ස්වභාවයේ කරුණු - නැත**

**08.** **ලැබීම් ගෙවීම් පිළිබඳ මාසික ප්‍රකාශන වැඩ ප්‍රගති වාර්තාව -**

**නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, වර්කමානයේ පවතින කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් 2020 ඔක්තෝබර් මාසයට අදාළ මුල්‍ය වාර්තාව 2020.11.13 දින මුදල් කමිටුවට ඉදිරිපත් වී නොමැති බව දන්වා සිටිනවා.

**09.** **වෙනත් කරුණු - නැත**

සභාවේ වැඩ කටයුතු මෙතනින් අවසන් විය.

අ.කළේ/ ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු
නගරාධිපති,
මොරටුව මහා නගර සභාව,
මොරටුව.

2020.12.10 දින,
මොරටුව මහා නගර සභා කාර්යාලයේදිය.